
# අභිධර්ම ප්‍රවේශය



WASANA PUBLICATIONS


නිලන්ත හෙට්ටිගේ

CamScanner

බුදු දහමේ ඉගැන්වෙන ගැඹුරු විෂය කරුණු පිළිබඳව
තුලනාත්මක විග්‍රහයක් සපයන ධර්ම ග්‍රන්ථය

# අභිධර්ම ප්‍රවේශය

මූලික අභිධර්මය, මාර්ගඵල, සමාධිය, ධ්‍යාන හා
සමාපත්ති පිළිබඳ විස්තර ඇතුළත්ය.



නිලන්ත හෙට්ටිගේ

CamScanner

අභිධර්ම ප්‍රවේශය

© පී. එම්. නිහාල් කුමාර

*ISBN 978-955-655-621-6*

ප්‍රථම මුද්‍රණය : 2009 මැයි

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සුචිකරණ දත්ත

හෙට්ටිගේ, නිලන්ත

අභිධර්ම ප්‍රවේශය/ නිලන්ත හෙට්ටිගේ
දන්කොටුව : වාසනා ප්‍රකාශකයෝ, 2009
පි. 80 : සෙ.මී. 21

ISBN 978-955-655-621-6
i. 294.3824 ඩිවි 21 ii. ග්‍රන්ථ නාමය
1. අභිධර්මය

අක්ෂර සංයෝජනය :
කුමුදිනි සුමාලි

පිට කවරය :
දිලාන් හේමන්ත

මුද්‍රණය : වාසනා ප්‍රින්ටර්ස්,
කටුකෙන්ද,
දන්කොටුව. 2009 - මැයි

ප්‍රකාශනය : වාසනා ප්‍රකාශකයෝ
කටුකෙන්ද,
දන්කොටුව.

# පෙරවදන

"සුපිරිසිදු බුදු දහම දැන ඉගෙන ගන්නට අවශ්‍ය නම් ඒ සඳහා ශ්‍රී ලංකාවට යා යුතුය." යන්න ලොව පුරා ප්‍රචලිත විද්වත් මතයකි. මෙරට කලක සිටම ධර්මද්වීපය ලෙස හඳුන්වනු ලැබීමට හේතු සාධක රැසක්ම මුල් වූ බව පෙනෙයි.

ථේරවාදී බෞද්ධ ගුරුකුලයට අයත් ප්‍රධාන සාහිත්‍ය කෘතීන් වැඩි වශයෙන්ම බිහිවූයේ ශ්‍රී ලංකාව ඇසුරු කොටගෙනය. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම ද මෙරටදී සිදුවූවකි. ත්‍රිපිටකයට ලියැවුණු මුල් අර්ථ කතා ශ්‍රී ලංකාවේදී සිංහල බසින් ලියනු ලැබ බුද්ධඝෝෂ හිමි අතින් පාලියට පරිවර්තනය වූ බවට පිළිගැනීමක් ඇත. ගත වූ සියවස් විසිදෙකකට අධික කාලයක් තුළ මෙරට බහුතර ජනතාව අදහනුයේ, අනුගමනය කරනුයේ බුදු දහමයි. මේ සියලුම කරුණු හා එක සේ වැදගත් වන තවත් දෙයක් ද ඇත. මූලික බුදු දහමෙහි එන අභිධර්මය නම් වූ ඉගැන්වීම් සමූහය තවදුරටත් පිළිගනිමින් ඒ පිළිබඳ විස්තරාත්මක සටහන් තැබීම සිදුවූයේ ශ්‍රී ලංකාවෙහිය. කෙසේ නමුත් වර්තමාන ශ්‍රී ලංකාවෙහි බෞද්ධයන් අතර අභිධර්මය පිළිබඳ ඇත්තේ අල්පතර දැනුමකි, අල්පතර අවබෝධයකි.

★ සමහරු අභිධර්මය බුද්ධ භාෂිතයක් නොවන බව කියති.

★ ඔවුන්ගේ අදහස වනුයේ අභිධර්ම පිටකය පසුකාලීන ධර්ම සංගායනාවලදී ඇතුළත් කරන ලද්දක් බවයි.

තවත් සමහරුන්ගේ මතය වී ඇත්තේ අභිධර්මය දෙවියන්ට වදාළ ධර්මයක් බැවින් එය මනුෂ්‍යයන්ට ගෝචර නොවන බවයි. මේ අතර නිවන් මගට අභිධර්මය අදාළ නොවන බව කියන පිරිසක් ද අප අතර සිටිති. අභිධර්මය පිළිබඳ වාද විවාද මෑත කාලීනව උත්සන්න වී ඇති සැටි අපට දැක ගත හැකිය. අභිධර්මය පිළිගන්නා පිරිස හා පිළිනොගන්නා පිරිස වශයෙන් සිරිලක බොදුනුවන් කොටස් දෙකකට බෙදී වෙන් වී ඇති අයුරු අද මනාව දැක ගත හැකිය.



CamScanner

අභිධර්මය පිළිබඳව වැඩි දෙනෙකුට කියවා තේරුම් ගත හැකි ග්‍රන්ථයක් ලියා සකස් කරන ලෙස මවෙත ඉල්ලීම් ලැබුණේ වසර කිහිපයක සිටය. මවිසින් මීට පෙර ලියා පළ කළ භාවනා කෘති පෙළ තුළින් ගැඹුරු ධර්ම කරුණු කෙරෙහි පාඨකයන්ගේ උනන්දුව වැඩි වී තිබීම මීට හේතුව විය හැකිය. ග්‍රන්ථ විශාල සංඛ්‍යාවකින් යුත් මවිසින් රචිත භාවනා පොත් පෙළ පළ කිරීමෙන් නොමඳ ශාසනික සේවයක් ඉටු කළ දංකොටුව වාසනා ප්‍රකාශන ආයතනයේ අධිපති නිහාල් කුමාර මහතා පොදු ජනතාවට උචිත අභිධර්ම ග්‍රන්ථයක වටිනාකම මවෙත පෙන්වා දෙමින් සරල බසින් අභිධර්ම ග්‍රන්ථයක් රචනා කරන මෙන් ඉල්ලා සිටියේය. "අභිධර්ම ප්‍රවේශය" නම් වූ මේ ග්‍රන්ථය ලියා පළ කරනුයේ පෙර කී ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙනි.

මෙම කෘතිය සාම්ප්‍රදායික අභිධර්ම ග්‍රන්ථවලට වඩා වෙනස් මගක් ගනියි. මූලික අභිධර්මය හා ඒ ආශ්‍රිතව විවාදයට ගැනෙන මාතෘකා රැසක් මේ ධර්ම ග්‍රන්ථයෙහි සාකච්ඡාවට බඳුන් කර ඇත. අභිධර්මයට අදාළ මූලික මාතෘකා හතර වන චිත්ත, චෛතසික, රූප, නිර්වාණ යන සතර පරමාර්ථ ධර්ම විග්‍රහ කිරීම සඳහා මෙම කෘතියෙහි වැඩි ඉඩක් වෙන් කර ඇත. ඊට අමතරව අභිධර්මයේම කොටසක් ලෙස සමහර අවස්ථාවලදී හඳුන්වනු ලැබෙන ධ්‍යාන, සමාපත්ති ආදී "වේදල්ල ධර්ම" කොට්ඨාසයන් ද මෙම කෘතිය තුළ සාකච්ඡාවට භාජනය කර ඇත.

බුදු දහමෙහි සාරය ලෙස බුදුන්ගේම පැසසුමට ලක්වූ අභිධර්ම, වේදල්ල යන ධර්ම කොට්ඨාසයන් ඇතුළත් මේ ග්‍රන්ථය ප්‍රබුද්ධ පාඨකයන්ගේ සදහම් පවස යම් තරමකට හෝ සනසාලනු ඇත යන්න මාගේ අපේක්ෂාවයි.

නිලන්ත හෙට්ටිගේ

"සුනිල"
කලහෙ,
වංචාවල.

දු.ක. : 0602931349/ 077 7185279

## - පටුන -

හැඳින්වීම

## I වන පාඩම් මාලාව

01. අභිධර්මය බිහිවීම
02. "අභිධර්මය" යන්නෙහි අර්ථය
03. අභිධර්මයෙහි අන්තර්ගතය
04. බෞද්ධ චතුස්කෝටික තර්කන ක්‍රමය
05. "චිත්ත" නම් වූ පරමාර්ථ ධර්ම
06. සිත ප්‍රභාෂ්වරයි
07. "චෛතසික" නම් වූ පරමාර්ථ ධර්මය
08. "රූප" නම් වූ පරමාර්ථ ධර්මය
09. ප්‍රසාද රූප
10. ගෝචර රූප
11. භාව රූප
12. හෘදය රූපය
13. ආකාශ ධාතුව
14. නිර්වාණ නම් වූ පරමාර්ථ ධර්මය

## II වන පාඩම් මාලාව

15. විවිධාකාර සිත්
16. චෛතසික විග්‍රහය
17. සර්ව චිත්ත සාධාරණ චෛතසික
18. ප්‍රකීර්ණක චෛතසික
19. අකුසල චෛතසික
20. ශෝභන සාධාරණ චෛතසික
21. අසාධාරණ ශෝභන චෛතසික
22. අභිධර්මයෙහි එන 'ක්ෂණවාදය'
23. 'චිත්ත වීථි' ක්‍රමය
24. රූප විභාගය
25. ප්‍රත්‍ය පිළිබඳ විස්තරය
26. ප්‍රඥප්ති ධර්ම හා පරමාර්ථ ධර්ම



CamScanner

27. භූමි පිළිබඳ විස්තර විභාග
28. කර්ම විභාගය
29. මරණය සහ පුනර්භවය
30. අභිධර්මය පිළිබඳ ආචාර්ය මතවාද
31. බෞද්ධ පරමාණුවාදය

## III වන පාඩම් මාලාව

32. වේදල්ල ධර්ම කාණ්ඩය
33. මහා වේදල්ල සූත්‍රය
34. චූල වේදල්ල සූත්‍රය
35. මහා පරිනිර්වාණ සූත්‍රය - ආලාර වේදල්ලය



CamScanner

## හැඳින්වීම

සිදුහත් බෝසතුන් බුද්ධත්වයට පත්වී දශක දෙකක් ගතවන තුරුම දේශනා කළ ධර්මයෙහි බෙදීමක් හෝ වර්ග කිරීමක් නොතිබුණි. ඒ ඒ අවස්ථාවලට උචිත පරිදි දේශනා කළ ධර්ම කරුණුවල අර්ථ විවරණය කිරීම්, උපදෙස්, උපමා කතා, උදාහරණ ආදිය සුදුසු පරිදි අඩංගු විය. මුල්කාලීනව දේශනා කළ සමහර සූත්‍රයන්හි භික්ෂූන් වහන්සේලා විසින් අනුගමනය කළ යුතු විනය හා සම්බන්ධ කරුණු පවා ඇතුළත් විය. බුද්ධත්වයෙන් විසි වසරකට පසු විධිමත් විනය නීති පැනවීම ආරම්භ විය. භික්ෂූත්වයට වැඩි අගයක් ලබාදීම, භික්ෂූන් වහන්සේලාගේ යහපැවැත්ම සහතිකවීම මෙන්ම ශාසනයේ චිරස්ථිතිය ද විනය නීති පැනවීමට හේතු කාරක විය. විනය නීති නොපැනවූ බුදුවරුන්ගේ ශාසනයන් වහා පිරිහී ගිය ආකාරයත්, විනය නීති පද්ධතියක් සහිත බුද්ධ ශාසනයන් දිගුකල් ආරක්ෂා වී පැවතීමත් බුදුන් වහන්සේගේ දිව්‍යමය ඥානය තුළින් හෙළිකර ගත් බව පිළිගනු ලැබේ.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් තුන් මසක් ඉක්ම යත්ම පැවැත්වූ පළමු ධර්ම සංගායනාවේදී ‘ධර්ම’ හා ‘විනය’ වශයෙන් ශ්‍රී සද්ධර්මය කොටස් දෙකකට විග්‍රහ කරන ලදී. එතැන් සිට ධර්ම හා විනය ලෙස ඉගැන්වීම් කොට්ඨාස දෙකක් දක්නට හැකි වුවත් ‘අභිධර්මය’ වෙනම පිටකයක ලා සැලකීමක් සිදු නොවුණි. බුදුවසින් පළමු වර්ෂය තුළ සිදු වූ පළමු ධර්ම සංගායනාවෙහිදී ‘අභිධර්ම පිටකය’ සංගායනා නොකිරීම පිළිබඳව ප්‍රබල මතවාද කිහිපයක්ම ඇති විය.

ඉන් එක් මතයකට අනුව අභිධර්ම පිටකයට අයත් කොටස් සූත්‍ර ධර්මයන්හිම ඇතුළත් කොට සංගායනා කර ඇත. තවත් මතයකින් කියවෙනුයේ ධර්ම හා විනය උගත් සියලු සංගීතිකාරක භික්ෂූන් වහන්සේලා අභිධර්මය ද වන පොත් කළ බවයි. සමහරුන්ගේ මතය වී ඇත්තේ අභිධර්මය බුද්ධ කාලයෙන් පසු රචනා කරන ලද්දක් බවයි. බුදුවසින් සියවස් ගණනක් මෙපිට ඉන්දියාවේ බිහිවූ සෞත්‍රාන්තිකවාදී ගුරුකුලයට අයත්

භික්ෂූහු අභිධර්ම පිටකය මුළුමනින්ම ප්‍රතික්ෂේප කළහ. සූත්‍ර පමණක් ගරු කළ ඒ ගුරුකුලය තුළ කිසිදු ආකාරයක අභිධර්ම ඉගැන්වීමක් අඩංගු නොවීය. ථේරවාදී බලකඳවුරටම අයත් සාර්වස්තිවාදීහු ද මූලික අභිධර්මය ප්‍රතික්ෂේප කළහ. ඔවුහු ප්‍රකරණ සතකින් යුතු නව අභිධර්ම පිටකයක් සකස් කළහ.

මෙහිදී සෘජුවම පැන නගින ප්‍රශ්නය වනුයේ බුද්ධ දේශනා තුළ අභිධර්මය අඩංගු නොවීද යන්නයි. බුදුන් වහන්සේ බුදුවී සත්වසකින් පෙර බුදුවරයන් ඉටු කළ චාරිත්‍රයක් ඉටු කරමින් දෙව් ලොවට වැඩම කර මාතෘ දිව්‍ය රාජයා ප්‍රමුඛ දෙවියන්ට අභිධර්මය දේශනා කළ බව මූලික බුදු දහම තුළ පිළිගැනෙන කරුණකි. ඒ අනුව අභිධර්මය කියා ධර්ම කොට්ඨාසයක් බුදුන් කල ද පැවති බව පෙනෙයි. තවද අභිධර්මය යන වදන සූත්‍රපිටකය තුළ කිහිප තැනකින්ම හමුවේ.

තමන් වහන්සේ වඩාත්ම ප්‍රිය කරන ධර්ම කොට්ඨාසය අභිධර්මය වන බව මුගලන් රහතන් වහන්සේ විසින් භික්ෂු සංඝයා ඉදිරියේ දේශනා කර ඇත.

අභිධර්ම, වේදල්ල යන ධර්ම කොට්ඨාස දෙක පහසුවෙන් තේරුම් ගත නොහැකි බවත්, මාර්ගඵල නොලද අය අභිධර්ම, වේදල්ල ධර්ම කොට්ඨාස අනුන්ට කියාදීම නොකළ යුතු බවත් බුද්ධ දේශනයේ සඳහන්ය. මාර්ගඵල නොලද අය එම ධර්ම කොට්ඨාස විස්තර කිරීමට යෑම අභිධර්ම, වේදල්ල ධර්ම කොට්ඨාසයන්හි විනාශයට මුල්වන බව ද බුදුන් වහන්සේ විසින් වදාරා ඇත.

බුදු දහම අතුරුදන් වන්නේ අනුපිළිවෙළක් අනුවය. පළමුව අභිධර්ම, වේදල්ල යන ගැඹුරු ධර්ම කොටස් ජනතාව අතරින් ගිලිහී යයි. ඉන් අනතුරුව අනිකුත් ධර්ම කොටස් ද ක්‍රම ක්‍රමයෙන් ජනතාව අතරින් ගිලිහී ගොස් ජාතක කතා වැනි වැදගත් කමින් අඩු ධර්ම කොට්ඨාස පමණක් ඉතිරි වේ. අනතුරුව ජාතක කතා ද මිනිසුන්ට අමතක වී ගොස් ධර්මය මෙලොවින් තුරන් වේ. එය සද්ධර්ම අන්තර්ධානයයි.

අද සද්ධර්ම අන්තර්ධානයේ ලකුණු පහළ වී ඇති බව අමුතුවෙන් කිව යුතු නොවේ. අභිධර්ම, වේදල්ල යන ගැඹුරු ධර්ම කොටස් අද සොයා ගැනීම පවා දුෂ්කර වී ඇත. කොටින්ම කියතොත් අභිධර්මයේ ප්‍රකරණ ග්‍රන්ථයන් දුටු හෝ ඇසුරු කළ භික්ෂූන් වහන්සේලා පවා සිටිනුයේ අතළොස්සකි. අද සිටින බෞද්ධයෝ වේදල්ල යනු කුමක්දැයි නොදනිති. නවාංග ශාස්තෘ ශාසනයට අයත් වේදල්ල ධර්මය කුමක්දැයි තෝරනු නොහැකිව සිටින මෙකල්හි අභිධර්ම, වේදල්ල යන ධර්ම කොට්ඨාසයන් දෙක අරභයා මේ කෘතිය සකස් කිරීමේ අරමුණ වනුයේ ද නුදුරු අනාගතයේදී විය හැකි සද්ධර්ම අන්තර්ධානය වළකාලීමයි. සද්ධර්මයෙහි සාරය බඳු වූ අභිධර්මය ද බුද්ධ ශාසනයේ ඵලය බඳු වූ වේදල්ල ධර්මය ද මෙම කෘතිය තුළ පියවරෙන් පියවර සරලව ඉගැන්වේ.

# 01. අභිධර්මය බිහිවීම

බෝසතුන් බුදුවීමෙන් අනතුරුව සත්වන වර්ෂයේදී පෙර බුදුවරුන් අනුගමනය කළ චාරිත්‍රයක් අනුව දෙව් ලොවට වැඩ දෙවියන්ට අභිධර්මය දේශනා කළ බවට පිළිගැනීමක් ඇත. එලෙස දෙව් ලොව දෙවියන්ට විස්තරාත්මකව දේශනා කළ අභිධර්මය බුදුන් වහන්සේ විසින් සැරියුත් රහතන් වහන්සේට ඉගැන්වූ බවත්, සැරියුත් රහතන් වහන්සේ විසින් බුදුන් වදාළ අභිධර්මය තවදුරටත් විස්තර විභාග සහිතව ඉදිරිපත් කළ බවත් මුල් ථේරවාදීන්ගේ පිළිගැනීමයි.

බුදුන් කල 'අභිධර්මයක් නොවී යයි ද අභිධර්මය පසුකාලීනව විසූ භික්ෂූන් වහන්සේලා විසින් නිර්මාණය කරන ලද්දක්' යැයි ද සමහරු කියති. මේ මතය සාවද්‍යය. අභිධර්මය ගැන සූත්‍රපිටකයේ මූලික සූත්‍රවල පවා සඳහන් වේ. බුදුන් කල විසූ හත්ථිසාරිපුත්ත හිමියන් අභිධර්මය උගත් අයෙකු බවත්, උන්වහන්සේ මහා කොට්ඨිත රහතන් වහන්සේගේ ධර්ම දේශනයකදී ඊට බාධාකාරී ලෙස හැසිරුණු බවත් සූත්‍ර පිටකයේ හත්ථිසාරිපුත්ත සූත්‍රයේ ඇක්වේ.

බුදුන් ජීවත්ව සිටියදී ධර්ම සහ විනය ලෙස පැවති ශ්‍රී සද්ධර්මය සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු පැවැත්වූ ප්‍රථම ධර්ම සංගායනාවේදී සූත්‍ර, විනය ලෙස වෙන් කළ බව සැලකේ. ප්‍රථම ධර්ම සංගායනාවේදී අභිධර්ම පිටකය සංගායනා කළ බව කිසිදු මූලාශ්‍රයක නොඇක්වෙතත් පළමු ධර්ම සංගායනාවේදී තුන්පිටකයක් සංගායනා කළ බව විනය පිටකයේ එන කරුණුවලින් පැහැදිලි වේ.

අභිධර්මය වෙනම පිටකයක් ලෙස සංගායනා කරන ලද්දේ බුදුවසින් වසර 100 කට පසු පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේදීය. එහිදී අභිධර්මය ග්‍රන්ථ 6 කට වෙන් කරන ලදී.

1. ධර්ම සංගනීප්‍රකරණය
2. විභංග ප්‍රකරණය
3. ධාතු කතා ප්‍රකරණය
4. පුද්ගල ප්‍රඥප්ති ප්‍රකරණය
5. යමක ප්‍රකරණය
6. පට්ඨාන ප්‍රකරණය, අභිධර්මයට අයත් මූලික ග්‍රන්ථ හයයි.

ඉන්දියාවේ ධර්මාශෝක රජතුමාගේ කාලය වන විට නියම බුදු දහම පිළිබඳ විවිධ මතිමතාන්තර පහළ වීම නිසා තෙවැනි ධර්ම සංගායනාවී එකල පවත්වන ලදී. ධර්මය පිළිබඳව තිබූ මතිමතා-න්තරවලට විසඳුම් ලෙස කතාවත්ථුප්‍රකරණය නම් සත්වෙනි අභිධර්ම ග්‍රන්ථය ද සාංගීතිකාරක තෙරුන් වහන්සේලාගේ මැදිහත්වීමෙන් සකස් කරන ලදී. ඒ අනුව අභිධර්මයට අයත් මූල ග්‍රන්ථ සංඛ්‍යාව හතක් දක්වා වැඩි විය.

මේ අතර අභිධර්ම ග්‍රන්ථයක් ලෙස සැලකිය හැකි පටිසම්භිදාමග්ග ප්‍රකරණය සූත්‍ර පිටකයට ඇතුළත් කිරීම විශේෂ සිද්ධියක් කොට සැලකිය හැකිය. සූත්‍ර පිටකය අවසානයට එක් වූ කොටස ලෙස සැලකෙන ඛුද්දක නිකායට අයත් පටිසම්භිදාමග්ග ප්‍රකරණය ආකෘතිය අතින් ද, අන්තර්ගතය අතින් ද අභිධර්ම ග්‍රන්ථයන්ට සමවේ.

## 02. 'අභිධර්ම' යන්නෙහි අර්ථය

'අභි' යන පදයත් 'ධර්මය" යන පදයත් එක්වීමෙන් 'අභිධර්මය' යන්න හැදේ. 'අභි' යන උපසර්ග පදය උසස් යන තේරුම ගෙන දෙයි. 'ධර්මය' යන්නෙන් කිසියම් ධර්මතාවක්, න්‍යායයක් හෝ නියමයක් හැඟෙයි. (උදාහරණ ලෙසඃ- උපදින සැවොම මිය යති. යන්න ධර්මතාවකි.) එබැවින් අභිධර්ම යන්නෙහි තේරුම 'උසස් වූ න්‍යායයන්', 'උසස් නියමයන්' ආදී ලෙස ගත හැකිය. අභිධර්මය උසස් මෙන්ම දුරවබෝධ ධර්ම කොට්ඨාසයක් ලෙස සූත්‍ර පිටකයේ සඳහන්ය. අභිධර්මය මනාව දත් අය බුදුන් කල පවා විරල වූ බව සූත්‍ර ධර්මයන් අනුව පැහැදිලි වේ.



CamScanner

# 03. අභිධර්මයෙහි අන්තර්ගතය

අභිධර්මයෙහි මූලික කාර්යය වනුයේ පරමාර්ථ ධර්ම පිළිබඳ විස්තර සැපයීමයි. පරමාර්ථ ධර්ම යනු කවරේ ද?

මෙලොව ඇතිතාක් සත්ත්වයන් ද, පුද්ගලයන් ද, ධර්මතාවයන් ද, සංකල්පයන් ද වර්ග දෙකකට බෙදිය හැකිය. ඒවා නම්,

1. ප්‍රඥප්ති ධර්ම

2. පරමාර්ථ ධර්ම යන ධර්මතා දෙකොට්ඨාසයයි.

ප්‍රඥප්ති ධර්ම යනු ව්‍යවහාරයේ පවතින සංකල්පයන්ය. ඒවා මිනිසුන් විසින් පනවා ගත් දේ මිස සුපිරිසිදු සත්‍යය නොවේ. උදාහරණයක් ලෙස,

'මිනිසා ඇවිදියි' යන්න ප්‍රඥප්ති සත්‍යයකි. මිනිසා යන වදන ද ඇවිදීම යන වදන ද හුදෙක් අප විසින් පනවා ගත්, සම්මත කරගත් දේ මිස ද්‍රව්‍යයනගේ යථාභූත ස්වරූප නිරූපණය කරන ප්‍රකාශ නොවේ. මිනිසාගේ ඉපදීම, කායික ක්‍රියාකාරිත්වය, මරණය, පුනරුත්පත්තිය වැනි සෑම දෙයක්ම ගැඹුරු සංකල්ප සරලව විස්තර කර දීම උදෙසා මිනිසුන් විසින් භාවිත කරන යෙදුම්ය.

ප්‍රඥප්ති ධර්ම හෙවත් 'පනවාගත්' දේ හැරුණු කොට වෙන යමක් පැවතිය හැකි ද?

අභිධර්මය අනුව එවැනි ධර්මතා පවතී. ඒවාට පරමාර්ථ ධර්ම යන්න ව්‍යවහාර වේ. එවැනි පරමාර්ථ ධර්ම 4 ක් ඇති බව අභිධර්මයේ දැක්වේ.

1. චිත්ත - සිතට ඇනීම.

2. චෛතසික - හැඟීම්.

3. රූප - පංචේන්ද්‍රියන්ගෙන් ලබන සංවේදන

යන තුන් ආකාරයේ ධර්මතාවයන් ලෝකය හා සම්බන්ධ

පරමාර්ථ ධර්ම තුනයි. ලෝකය හා සම්බන්ධ නොවූ, ජීවිතය හා සම්බන්ධ නොවූ එක් පරමාර්ථ ධර්මයක් ඇත. එය,

4. නිර්වාණ - නිවන නම් වූ පරමාර්ථ ධර්මයයි.

මෙකී පරමාර්ථ ධර්මවල සුවිශේෂී ලක්ෂණ කිහිපයක්ම දැකිය හැකිය.

1. පරමාර්ථ ධර්ම තව දුරටත් සරල කළ නොහැකිය. ඒවා තව දුරටත් සරල සංකල්ප මත විස්තර කළ නොහැකිය. සිතට දැනීම් ද, සිතිවිලි ද පංචේන්ද්‍රියන්ට ගොදුරු වන අරමුණු ද තව දුරටත් සරල ආකාරයට විස්තර කළ නොහැකි බව පැහැදිලිය. එලෙසම නිවන හෙවත් නිර්වාණය ද තවදුරටත් සරල ලෙස දැක්විය නොහැකිය.

2. චිත්ත, චෛතසික හා 'රූප' යන පරමාර්ථ ධර්ම තුනම එකිනෙක හා සම්බන්ධය. ඒවා විස්තර කළ යුත්තේ එකිනෙක ආධාරයෙනි. ඇසට ගෝචර වන රූපයක් ඇස හා හමුවීමෙන් සිතට එම රූපය පිළිබඳ සංවේදනය දැනෙයි. ඊට 'චිත්ත' යන නම කියනු ලැබේ. එකී සංවේදනය නිසා කිසියම් හැඟීමක් ඉපදිය හැකිය. එවැනි හැඟීම් 'චෛතසික' නම් වේ. මෙම සබඳතාව නිසා චිත්ත, චෛතසික හා රූප යන පරමාර්ථ ධර්ම එකිනෙක ප්‍රතිබද්ධව පවතියි. එකට ඉපිද නැසෙන පරමාර්ථ ධර්ම යනුවෙන් කියනු ලැබේ.

3. නිර්වාණය යන පරමාර්ථ ධර්මය පෙර කී පරමාර්ථ ධර්ම තුනටම වඩා වෙනස්ය. නිර්වාණයේ ඉපදීමක්, අවසානයක්, හටගැනීමක්, ආරම්භයක් හෝ අවසානයක් නැත. එබැවින් නිවන 'අසංඛත' ධර්ම ගණයට වැටේ. පෙර කී චිත්ත, චෛතසික, රූප යන පරමාර්ථ ධර්ම 'සංඛත' ගණයට වැටෙයි. සංඛත ගණයේ පරමාර්ථ ධර්මවල,

   i. සකස්වීමක් ඇත.

   ii. ඉපදීමක් ඇත.

   iii. පැවතීමක් ඇත.

iv. අනෙකක් මත ආධාර කොට පවතියි.

v. නැසීමක් ඇත.

එසේ නම් නිවනට ඇත්තේ කවරාකාර පැවැත්මක් ද? 'නිවනක් ඇත' යන්න සත්‍ය නම් නිවන යමක් ආධාර කොට පැවතිය යුතුය. නිවනක් නැති නම් නිවන් මගක් ද නැත. නිවනට පැමිණෙන්නෙක් ද නැත. එබැවින් 'නිවනක් නැත' යන්න ද නිවැරදි ප්‍රකාශයක් නොවේ. එබැවින් 'ඇත' හෝ 'නැත' යන පිළිතුරු දෙකම නිවන සම්බන්ධව වලංගු නොවේ.

## 04. බෞද්ධ චතුස්කෝටික තර්කන ක්‍රමය

එදිනෙදා අප විසින් භාවිත කරන තර්කන ක්‍රමය ද්විකෝටික තර්කනය නම් වේ. යමක් 'ඇත' හෝ 'නැත' යන්න මෙවැනි තර්කන ක්‍රමයක් මගින් ලබා ගත හැකි අවසාන පිළිතුරයි.

මූලික බුදු දහමේ ඉගැන්වෙන බොහෝ කරුණු පහදා දී ඇත්තේ ද්විකෝටික තර්කන ක්‍රමය මගිනි. පහත සඳහන් උදාහරණවලින් ඒ බව මනාව පැහැදිලි වනු ඇත.

1. දුන් දේහි විපාක ඇත
2. පිංකම්වල විපාක ඇත යන ඉගැන්වීම් දෙක ඇත යන අර්ථයේ ප්‍රකාශ දෙකකි.
3. ආත්මයක් නොමැත. යනුවෙන් බුදු දහමෙහි ඉගැන්වේ එය නැත යන අර්ථයේ ප්‍රකාශයකි.

මෙකී ඇත, නැත යන ප්‍රකාශ දෙකෙන් ඔබ්බට ගොස් ගැටලු විසඳූ අවස්ථා කිහිපයක්ම බෞද්ධ ඉගැන්වීම් තුළ හමුවේ.

රහතන් වහන්සේ මරණින් මතු නැවත ඉපදෙන්නේ ද යන ප්‍රශ්නය එක් පුද්ගලයෙක් බුදුන්ගෙන් විමසීය.

ඊට ඔව් යන පිළිතුර ද නොගැළපේ, රහතන් වහන්සේට මතු භවයක් නොමැති බැවිනි.

ඊට නැත යන පිළිතුර ද නොගැළපේ, රහතන් වහන්සේ පිරිනිවනට එළඹෙන බැවිනි.

එබැවින් මෙය ඇත හා නැත යන අර්ථ දෙකම ප්‍රතික්ෂේප කර පිළිතුරු දුන් අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.

තවත් මෙවැනිම උදාහරණ කිහිපයක් වසර දෙදහසක් පමණ පැරණි මිලින්ද ප්‍රශ්නය නම් බෞද්ධ ග්‍රන්ථයෙහි හමුවේ. මිලිඳු රජු පෙර කල ඉන්දියාව ආක්‍රමණය කළ යෝනක රණකාමියෙකි. නාගසේන රහතන් වහන්සේ දක්ෂ කථිකයෙකු ලෙස එකල නම් දරා සිටි අයෙකි. බුදු දහම පිළිබඳ කුතුහලයක් ඇතිව මිලිඳු රජු නාගසේන හිමියන් හමුවී මූලික බුදු දහමේ සංකල්ප ගැන දීර්ඝ සාකච්ඡාවක නිරත වූයේය.

'බුදු දහම අනුව, යම් පුද්ගලයෙකු මිය ගිය පසු නැවත උපදියි. මෙලෙස උපදිනුයේ ඒ පුද්ගලයා ද? නැතහොත් වෙනත් පුද්ගලයෙකු ද?'

මෙම උභතෝකෝටික ප්‍රශ්නයට නාගසේන හිමියන් පිළිතුරු සැපයුවේ 'නච සො', 'නච අඤ්ඤො' වශයෙනි. මෙහි තේරුම 'ඔහුත් නොවේ වෙනෙකෙකුත් නොවේ' යන්නය.

සත්ත්වයා මියගිය පසු ඔහුම ඊළඟ භවයෙහි උපදියි යන පිළිතුර නාගසේන හිමියන් විසින් පැවසුවේ නම් එම පිළිතුර දෝෂ සහගත බව මිලිඳු රජු විසින් පවසනු ඇත. මන්දයත් මරණයේදී සත්ත්වයා කය හැර යන බැවින් ඔහුම ඊළඟ භවයෙහි ඉපදීමක් ඔප්පු කළ නොහැකි බැවිනි.

අනිත් අතට සත්ත්වයා මිය යාමෙන් පසු පුනරුත්පත්තිය ලබනුයේ වෙන සත්ත්වයෙකු නම් පෙර භවයෙහි සිටි සත්ත්වයා කළ කර්මවලට මතු භවයෙහි උපන් සත්ත්වයා වග නොකියනු ඇත. කර්ම බලපෑම භවයෙන් භවය නොසිඳී පැවතෙන බව බුදු දහමෙහි තදින්ම ඉගැන්වෙන කරුණකි. වඩා නිරවුල්ව දක්වතොත්, මතු උපතක් ලබනුයේ මිය යන සත්ත්වයෙකු ද යන ප්‍රශ්නයට ඔව් සහ නැත යන පිළිතුර දිය හැකිය.

මේ අනුව, බුදු සමය තුළ කිසියම් ප්‍රශ්නයකට ලබා දියහැකි

පිළිතුරු, හතර ආකාරයක් ගනියි.

1. ඔව්

2. නැත

3. ඔව් සහ නැත

4. ඔව් ද නොවේ. නැත ද නොවේ.

යන ආකාරයේ පිළිතුරු කිසියම් ප්‍රශ්නගත කරුණක් සඳහා ලැබීමට හැකිය. චතුස්කෝටික තර්කන ක්‍රමය බුදු සමය තුළ වර්ධනය වූවකි යන්න බොහෝ විට කියනු ලබන්නේ මෙම හේතුව නිසාය.

නිවන, පුනර්භවය, කර්මය වැනි ගැඹුරු සංකල්පයන් අවබෝධ කර ගැනීමට බොහෝ දෙනෙකු අපොහොසත්ව ඇත්තේ පෙර කී චතුස්කෝටික තර්කන ක්‍රමය වැඩි දෙනෙකුට නුහුරු බැවිනි. මෙතෙක් විස්තර කළ එම සංකල්ප ප්‍රවේශයෙන් කියවා අවබෝධ කරගත හොත් බුදු දහමෙහි එන ගැඹුරු සංකල්ප ඉතා පහසුවෙන්ම අවබෝධ වනු ඇත.

## 05. 'චිත්ත' නම් වූ පරමාර්ථ ධර්මය

මිනිස් සිත අපූරු යන්ත්‍රයකි. සිතෙහි ක්‍රියාකාරිත්වයෙන් එක් අංශයක් 'චිත්ත' යන පරමාර්ථ ධර්මයට අයත්ය. ඇස, කන, නාසය, දිව, කය යන පංචේන්ද්‍රියන්ගෙන් අපගේ සිතට තොරතුරු ගලා එයි. එම තොරතුරු මගින් අපගේ සිත දැනුවත් වෙයි. මේ ආකාර දැනුවත්වීම්, පෙනීම, ඇසීම, ගඳ සුවඳ දැනීම රස දැනීම, ස්පර්ශය, උණුසුම, වේදනාව දැනීම, සංවේදන ලැබීම ආදී ලෙස විවිධාකාර වෙයි. මේ සෑම ආකාරයකම දැනුවත්වීම් චිත්ත නම් පරමාර්ථ ධර්මයේ විවිධ ස්වභාවයන්ය. ඒ දැනුවත්වීම සමගම උපදින මානසික තත්ත්වයන් ද 'චිත්ත' නම් වේ.

'චිත්තය' දැනීම් හා සම්බන්ධ සිතිවිලි කොට්ඨාසය ලෙස තේරුම් ගැනීම සුදුසුය. අභිධර්මයෙහි චිත්ත හෙවත් 'සිත්'වල පැවැත්ම අවස්ථා තුනකට බෙදා වෙන් කර දක්වයි.



CamScanner

1. උත්පාද - සිතුවිලි ඉපදීම

2. ස්ථිති - සිතුවිල්ල පැවතීම

3.භංග - සිතුවිල්ල බිඳවැටීම

මේ ක්‍රියා තුනටම සමාන කාලයක් ගතවන බවට අභිධර්මයෙහි ඉගැන්වේ. එනම් 'සිතක්' හටගෙන නැවත නැසීයාමට සමාන කාල පරතර තුනක් ගතවේ. සිතක් ඉපිද නැවත නැසීයාමට ගතවන කාලය 'චිත්තක්ෂණයක්' නම් වේ. එක සිතක් හටගෙන නිරුද්ධවීමට (නැසීයාමට) ගතවන කාලය ගණනය කළ නොහැකි තරම් කුඩාය. එක තත්පරයක් තුළ සිතක් නොව සිත් පරම්පරා ගණනක් ඇතිවේ. 'සිත්' පහළ වනුයේ ද සිත් පරම්පරා වශයෙන් ඒ ඒ 'සිත්' කිසියම් නිශ්චිත පිළිවෙළකට සකස් වී එකිනෙක වහ වහා ඉපිද පැවතී නැසී යාමෙනි. මෙවැනි එක් සිත් පරම්පරාවකට 'චිත්ත වීථිය' යන නම යෙදෙයි.

අභිධර්ම ක්‍රමය අනුව සිත් පහළ නොවන අවස්ථා තුනකි.

1. අසංඥ භූමියේ උපන් සත්ත්වයන්ගේ සිත් පහළ නොවේ.
2. රහතන් වහන්සේ නිරුපධිශේෂ නිර්වාණයට එළඹි පසු (මිය ගිය පසු) සිත් පහළ නොවේ.
3. නිරෝධ සමාපත්තියට වන් කල ද සිත් පහළ නොවේ.

මේ අවස්ථා තුන හැරුණු කල අන් හැම කල්හිම 'සිත්' පහළ වෙති.

මිනිසෙකු නින්දට වන් කල ද සිත් පහළ වන බව දත යුතුය. නින්දේදී සිහින පෙනෙනුයේ එම අවස්ථාවේදීද සිත අවධියෙන් සිටින බැවිනි. සිත අවධියෙන් සිටීම යනු 'සිත් පහළවීම' යන දෙයම වේ. යමෙකු සිහි විසංඥ වූ කල ඔහුගේ සිත අක්‍රිය වන බව සාමාන්‍ය ව්‍යවහාරයේ පවතින පිළිගැනීමයි. බෞද්ධ මනෝවිද්‍යාව අනුව සිහි නැතිවීම යනු එවැනි තත්ත්වයක් නොවේ. සිහි නැතිවීමේදී සිදුවන්නේ සංවේදනවලට ප්‍රතිචාර දැක්වීම නැවතීමයි. වෙනත් අයුරකින් කිවහොත් සිහි නැතිවූවෙකුගේ සිත යම් ප්‍රමාණයකට ක්‍රියාත්මක වෙමින් පවතී.

## 06. සිත ප්‍රභාෂ්වරයි

චිත්ත නම් වූ පරමාර්ථ ධර්මයෙහි ස්වභාවය තවදුරටත් විස්තර කිරීම සුදුසුය. චිත්තයෙහි මූලික ස්වරූපය 'ඉතා පිරිසිදු' ස්වභාවයක් ගන්නා බව බුද්ධ දේශනයන්හි සඳහන්ය.

'පභස්සරමිදං භික්ඛවේ චිත්තං තංචඛො

ආගන්තුකේහි උපක්කිලිස්සේහි උපක්කිලිට්ඨං'

යනුවෙන් මෙම කරුණ ධර්මයෙහි දක්වා ඇත.

'සිත (මූලික වශයෙන්) පිරිසිදුය. ආගන්තුකව පැමිණෙන කිලිටි දේ නිසා සිත ද කිලිටි වෙයි.'

යන තේරුම ඊට ඇත. සිත කිලිටි කරවන ධර්මතාවන්ට කෙලෙස් යන නම යෙදෙයි. 'කෙලෙස්'වලින් සිත මුදවා ගත් කල සිත පිරිසිදු වේ. සත්‍යාවබෝධයට පැමිණීමට උත්සාහ කරන පුද්ගලයා සිත තුළින් කිලිටි සිතිවිලි පලවා හැරිය යුතුය. එවිට කෙලෙස්වලින් අපිරිසිදු සිත පිරිසිදු වෙයි. පිරිසිදු සිත ප්‍රභාෂ්වරය, ශක්තිමත්ය, කර්ම න්‍යාය. මෙලෙස පිරිසිදු කර ශක්තිමත් බවට හැරවූ සිත සත්‍යාවබෝධය කරා පහසුවෙන්ම යොමු කළ හැකිය. මෙහිදී සිත කෙලෙස්වලින් මුදවා ගැනීම හා සත්‍යාවබෝධය යනු එක් කාර්යයක් නොව කාර්යයන් දෙකක් බව වටහා ගත යුතුය.



CamScanner

# 07. 'චෛතසික' නම් වූ පරමාර්ථ ධර්මය

සිතෙහි ප්‍රධානතම කාර්යයන් දෙකකි.

1. හැඟීම් ඇතිවීම.
2. සංවේදන ආශ්‍රිතව දැනීම් ඇතිවීම.

එම කාර්යයන් දෙකයි. මෙකී 'දැනීම්'වලට අභිධර්ම ක්‍රමයේදී 'චෛතසික' යන නම යෙදේ.

සෑම ආකාරයකම සිතක (සිතුවිලිවල) දැකිය හැකි චෛතසිකවලට 'සර්ව චිත්ත සාධාරණ චෛතසික' යන නම යෙදේ. සර්ව චිත්ත සාධාරණ චෛතසික ගණිනින් හතකි (7). ඒවා මෙසේය.

1. ස්පර්ශය (ඵස්ස):

කිසියම් අරමුණක් සිතෙහි ගැටීම මෙයින් අදහස් වේ.

2. වේදනා (වින්දනය):

කිසියම් අරමුණක් ආශ්‍රිතව දැනෙන වින්දනයක් වේදනා නම් වේ. වේදනාව තුන් ආකාරය.

★ තමාට රිසි වූ අරමුණක් නිසා 'සැප වේදනා' පහළ වේ. මේවා 'සෝමනස්ස වේදනා' යනුවෙන් ද හැඳින්වේ.

★ තමාට නොරිසි වූ අරමුණක් නිසා දුක් සහගත වේදනා පහළ වේ. මේවා 'දෝමනස්ස වේදනා' නම් වේ.

★ රිසි හෝ නොරිසි දෙපක්ෂයටම බර නොවූ වේදනාව 'උපේක්ෂා වේදනා' නම් වේ.

3. සංඥාව:

කිසියම් අරමුණක් හඳුනාගැනීම මෙයින් අදහස් වේ. ඈතින් එන මිනිසෙකු දකින අයෙකුට 'මේ මිනිසෙක්' යන සංඥාව පහළ වෙයි. මේ ආකාරයට සුළු මොහොතක් තුළ එකිනෙකට වෙනස් විවිධාකාර සංඥාවන් රාශියක් මනස තුළ උපදියි.



CamScanner

4. චේතනාව:

කිසියම් ක්‍රියාවක් සඳහා සිත පෙලඹවීම චේතනාවට අයත් කාර්යයයි. 'කර්මය' යනුවෙන් හැඳින්වෙනුයේ ද මෙකී චේතනාවමය. කර්ම විපාක සකස් වනුයේ ද චේතනාවට අනුරූපවය.

5. ඒකාග්‍රතාව:

සිත කිසියම් අරමුණක රඳවා තැබීම ඒකාග්‍රතාවෙහි කාර්යයයි. ඒකාග්‍රතාව ප්‍රබල වන විට සමාධිගතවීම යනුවෙන් ව්‍යවහාර වේ.

6. ජීවිතේන්ද්‍රිය:

සිතෙහි ඇති පුදුමාකාර ස්වභාවයක් වනුයේ නොනවත්වා ක්‍රියාකාරි වීමයි. අවධියෙන් සිටින විට මෙන්ම නින්දේදී ද සිත ක්‍රියාකාරි වේ. සිතෙහි ක්‍රියාකාරිත්වය සම්පූර්ණයෙන්ම නවතිනුයේ රහත් වී පිරිනිවන් පෑ කලය. නිරෝධ සමාපත්තියට සමවැදුණු කල්හි ද සිත තාවකාලිකව අක්‍රිය වේ. සිතෙහි ක්‍රියාකාරිත්වය එක දිගට පවත්වාගෙන යන බලවේගයට ජීවිතේන්ද්‍රිය යන නම යෙදේ. ජීවිතේන්ද්‍රිය පිළිබඳව අභිධර්මයෙහි මෙන්ම සූත්‍ර ධර්මයෙහි ද විස්තර වේ. සත්ත්වයා මරණයට පත්වීමේදී ජීවිතේන්ද්‍රිය සිඳී යයි.

7. මනසිකාරය:

කිසියම් අරමුණක් සිතින් විමසා බැලීම මනසිකාර නම් වේ. අපට අවශ්‍ය අරමුණු ගැන සිත යොමුකර බැලීම මනසිකාරයට අයත් වැදගත්ම කාර්යයකි.



CamScanner

# 08. 'රූප' නම් වූ පරමාර්ථ ධර්මය

ඉන්ද්‍රියයන් මගින් ගෝචර කරගන්නා ධර්මතාවන්ට රූප යන නම යෙදෙයි. මෙහිදී ඇස, කන, නාසය, දිව හා කය යන පංචේන්ද්‍රියන්ට ගෝචර වන ධර්මතාවන් සියල්ලම රූප යනුවෙන් හැඳින්වෙන බව සැලකිල්ලට ගත යුතුය. රූප නම් වූ පරමාර්ථ ධර්මයේ විවිධාකාර ස්වරූපයන් ගැන මෙතැන් සිට විස්තර කෙරේ.

1. භූත රූප:

යමක තද හෝ බුරුල් ගතිය ද උකු ගතිය හෝ දියාරු ගතිය ද යනාදී ගතිගුණ තීරණය කිරීම භූත රූපවල කාර්යයයි. එවැනි භූත රූප හතරක් ඇත.

★ පඨවි ධාතු: තද ගතිය මෙයින් අදහස් වේ. තද ගතිය වැඩි දේ පඨවි හෙවත් ඝන ද්‍රව්‍ය නම් වේ.

★ ආපෝ ධාතු: වැගිරෙන ගතිය මෙයින් අදහස් වේ. වැගිරෙන ගතිය වැඩි දේ 'ආපෝ' හෙවත් ද්‍රව්‍ය නම් වේ.

★ තේජෝ ධාතුව: යමක ඇති උණුසුම තේජෝ ධාතුව නම් වේ. ගින්නෙහි තේජෝ ධාතුව වඩාත් ප්‍රකට වේ.

★ වායෝ ධාතුව: විසිරී යන ස්වභාවය වායෝ ධාතු නම් වේ. වාතයෙහි විසිරී යන ගතිය වැඩි බැවින් වායෝ ගුණය එහි අධික බව කියනු ලැබේ.

අභිධර්ම ක්‍රමය අනුව සතරාකාර ධාතූන් ගැන ඉගෙන ගැනීමේදී දැනගත යුතු වැදගත් කරුණක් ඇත. ලොව ඇති සෑම ද්‍රව්‍යයක, ද්‍රවයක හා වායුවක මෙකී සතරාකාර ගුණ අඩු වැඩි වශයෙන් පවතින බවයි. උදාහරණයක් ලෙස ජලයෙහි පඨවි ගුණය, ආපෝ ගුණය, තේජෝ ගුණය හා වායෝ ගුණය යන ගුණ සතරම ඇත. සාමාන්‍ය ජලයෙහි ආපෝ ගුණය හෙවත් වැගිරෙන සුලු ගතිය මැනවින් ප්‍රකට වේ. ජලය මිදුණු පසු එහි පඨවි ගුණය ප්‍රකට වේ. ජලය රත් කරත්ම එහි තේජෝ ගුණය

හෙවත් රස්නය වැඩි වී ගොස් අවසානයේ එය වායෝ ගුණය ප්‍රකට කරමින් උතුරා යයි.

අනෙකුත් ද්‍රව්‍ය ගැන ද මේ ආකාරයටම තේරුම් ගත යුතුය.

## 09. ප්‍රසාද රූප

ඇස, කන, නාසය, දිව, කය වශයෙන් සංවේදන ඉන්ද්‍රියයන් පහක් මනුෂ්‍යයාට ඇත. අනෙක් සතුන්ට ද අඩු වැඩි වශයෙන් මෙවැනි ඉන්ද්‍රියයන් පිහිටා ඇත. එකී සංවේදන ඉන්ද්‍රියයන්හි බාහිර අරමුණු වැදීමෙන් පසු ඒවා සිතට ග්‍රහණය වේ. සංවේදී ඉන්ද්‍රියයන්ගේ බාහිර අරමුණු ග්‍රහණය කරගන්නා කොටස් ප්‍රසාද රූප නම් වේ. එවැනි ප්‍රසාද රූප පහකි.

1. චක්ඛු ප්‍රසාදයː

   ඇසෙහි පිහිටයි. ඇසට වැටෙන රූප ග්‍රහණය කරගනියි.

2. ශ්‍රෝත්‍ර ප්‍රසාදයː

   කනෙහි පිහිටයි. බාහිර ශබ්ද ග්‍රහණය කරගනියි.

3. ඝාණ ප්‍රසාදයː

   නාසයේ පිහිටයි. ගඳ, සුවඳ ග්‍රහණය කරගනියි.

4. ජිව්හා ප්‍රසාදයː

   දිවේ පවතින රසංකුරයන්හි මෙය පිහිටයි. රසය ග්‍රහණය කරගනියි.

5. කාය ප්‍රසාදයː

   මෙවා කයෙහි පිහිටන සංවේදන ග්‍රහණය කිරීමේ ප්‍රදේශයන්ය. උණුසුම, ශීතල, වේදනාව,ස්පර්ශය ආදී වූ සංනිවේදනයන් ග්‍රහණය කරගැනීමට කයෙහි මෙවැනි ව්‍යුහ පිහිටා ඇත. කිසියම් සංනිවේදනයක් හඳුනා ගැනීම ප්‍රසාද රූපවලින් සිදුවන කාර්යයක් නොවේ.

ප්‍රසාද රූපවලින් සිදු කෙරෙනුයේ සංවේදන ග්‍රහණය කරගැනීම මගින් සංවේදන හඳුනා ගැනීමට උපකාරී වීමයි. සංවේදන හඳුනා ගන්නේ මනසිනි. ඒ මෙසේය,

බාහිර රූපයක් ප්‍රසාද රූපයක ගැටීමෙන් එම රූපය ගැන දැනීම හෙවත් රූප විඤ්ඤාණය සිතෙහි පහළ වේ. රූපය දකිනුයේ රූප විඤ්ඤාණයෙනි. මෙලෙසම ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන සංවේදන හඳුනා ගැනීම තේරුම් ගත යුතුය.

මෙහිදී එක් එක් ප්‍රසාද රූපවල ක්‍රියාකාරිත්වයෙහි වෙනස්කම් ඇති බව තේරුම් ගත යුතුය. දිවට රසයක් දැනෙනුයේ එම රූපය දිවෙහි රසාංකුර මත ගැටීමෙනි. දුර ඇති රස දැනගැනීමට දිවට නොහැකිය. එබැවින් දිවෙහි ඇති ජිව්හා ප්‍රසාද රූපයන් 'සම්ප්‍රාප්ත විෂයග්‍රාහක' වර්ගයට අයත් වේ. එනමුත් ඇසට දුර ඇති දේ පෙනේ. ඇසෙහි ගැටුණු දේ ඇසට නොපෙනේ. එබැවින් ඇසෙහි ඇති ප්‍රසාද රූප 'අසම්ප්‍රාප්ත විෂයග්‍රාහක' ගණයට අයත් බව තේරුම් ගත යුතුය.

## 10. ගෝචර රූප

ඇස, කන, නාසය, දිව, කය යන ඉන්ද්‍රියයන්ට අරමුණු වන බාහිර රූප සියල්ල ගෝචර රූප නම් වේ. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ වශයෙන් ගෝචර රූපවල ආකාර පහකි.

## 11. භාව රූප

සත්ත්වයාගේ ස්ත්‍රී, පුරුෂ භේදය තීරණය කරනු ලබන්නේ භාව රූප මගිනි. 'ස්ත්‍රී භාව රූප' මගින් උපදිනා සත්ත්වයා ස්ත්‍රියක බවට පත්වේ. 'පුරුෂ භාව රූප' මගින් උපදිනා සත්ත්වයා පුරුෂයෙකු බවට පත් වේ. ස්ත්‍රියකගේ ශරීරයේ හැම තැනකම ස්ත්‍රී භාව රූප ද පුරුෂයෙකුගේ ශරීරයේ හැම තැනකම පුරුෂ භාව රූප ද සටහන් වී ඇත. මේ ආකාරයට ස්ත්‍රී හා පුරුෂ ලෙස භාව රූප සටහන් වීමට හේතුව ප්‍රතිවිරුද්ධ පක්ෂය කෙරෙහි ඇති වන ඇල්මයි. පුරුෂයන් ස්ත්‍රීන් කෙරේ



CamScanner

ඇලුම් කිරීම නිසා මතු ආත්ම භවවලදී ද පුරුෂයන් ලෙසම උපත ලබනු ඇත. ස්ත්‍රීන් ද මෙලෙසම මතු ආත්ම භවවල ස්ත්‍රීන් ලෙසම උපත ලබනු ඇත.

එසේ නොමැතිව ස්ත්‍රීන් ස්ත්‍රී වර්ගයා කෙරෙහි ඇල්ම දැක්වුවහොත් ස්වරූප වෙනස් වී ඊළඟ ආත්මවල පුරුෂයෙකු ලෙස ඉපදීමට ඉඩ ඇත. මෙම පරිවර්තනය බොහෝ විට ක්‍රම ක්‍රමයෙන් ආත්ම භව ගණනාවක්ම ඉදිරියට සිදුවිය හැකි දෙයකි. සමහර විට මෙම පරිවර්තනීය යුගය ආත්ම 500 ක් වුව ද දිගු විය හැකිය. එවැනි පරිවර්තනීය කාලයක් පසු කරන අය නපුංසකව ඉපදීමට ඉඩකඩ වැඩිය. බලගතු කුසල කර්ම නිසා ස්ත්‍රියක පුරුෂයෙකු ලෙස මතු ආත්ම භවයක උපත ලැබීමට ඉඩ ඇත. ගෞතම බුදුන් ලෙස බුදු වූයේ කල්ප විශාල ගණනකට පෙර සිටි ස්ත්‍රියකි. ඇය බුදුවීමට ඇති ආශාව නිසාම පුරුෂාත්ම භාවයක් ලැබ පාරමීදම් සම්පූර්ණ කර බුද්ධත්වයට පත් වූවාය. අනිත් අතට පුරුෂයෙකු බලගතු පාප කර්මයක විපාක හේතුවෙන් ස්ත්‍රියක් බවට පත්වීමට ඉඩ ඇත. ආනන්ද හිමියන් පෙර ආත්ම භවයක දී කළ පාප කර්මයක් හේතුකොට ගෙන ස්ත්‍රියක් ලෙස ද, නපුංසකයෙකු ලෙස ද ආත්ම ගණනාවක්ම උපන් බව ධර්මයේ සඳහන්ය.

කාම අපරාධවල නියැළෙන පුරුෂයන් මරණින් මතු ස්ත්‍රීන්ව හෝ නපුංසකයන්ව උපදින බව සිත්හි තබා ගැනීම වැදගත්ය. බුදුන් කල විසූ එක් සිටුවරයෙකු පුරුෂ රූපයන්ට ඇල්ම ඇති කරගත් නිසා තම ජීවිත කාලය තුළදීම ස්ත්‍රියක් බවට පත්ව දරුවන් බිහි කළ බව බෞද්ධ සාහිත්‍යයෙහි දැක්වේ. මෙවැනි සිදුවීම් අදට ද විරල නැත.

## 12. හෘදය රූපය

කිසියම් සත්ත්වයෙකු යම් භවයක ප්‍රතිසන්ධිය ලබන විට (පිළිසිඳ ගන්නා විට) පළමුව පහළ වනුයේ හෘදය රූපයයි. හෘදය වස්තුව හටගනුයේ මෙකී හෘදය රූපය ඇසුරු කොට ගෙනය.



CamScanner

## 13. ආකාශ ධාතුව

කිසිදු ආකාර රූපයක් නොමැති හිස් ඉඩකට ආකාශ ධාතුව යන වදන යෙදේ. අප දකින අහසෙහි එපිට පිහිටි අජටාකාශය හිස් ඉඩවලින් වැඩි වශයෙන් පිරී පවතී. මෙවැනි හිස් ඉඩකට ආකාශ ධාතුව යනුවෙන් කියනු ලැබේ.

## 14. නිර්වාණ නම් වූ පරමාර්ථ ධර්මය

පරමාර්ථ ධර්ම සතරකි. ඒවා පිළිවෙළින් චිත්ත, චෛතසික, රූප හා නිර්වාණ නම් වේ. මුලින් සඳහන් කළ චිත්ත, චෛතසික හා රූප යන පරමාර්ථ ධර්මවලට වඩා සහමුලින්ම වෙනස් වූ ගුණ නිර්වාණ නම් වූ පරමාර්ථ ධර්මයෙහි පවතියි.

1. නිවනට හටගැනීමක් නැත.
2. පවත්නා යම් තැනක් නැත.
3. කිසිවක් ආධාර කොට පැවතීමක් එහි නැත.
4. නිවනෙහි ආරම්භයක් හෝ අවසානයක් පෙන්වීමට නොහැකිය.

නිවන විස්තර කරන සමහර තැන්හි හිරු හෝ සඳු නොමැති කිසිදු ජීවී ලොවක් නොමැති තත්ත්වයක් (ආයතනයක්) ලෙස විග්‍රහ කර ඇත.

නිවනෙහි ප්‍රධාන ආකාර දෙකකි.

1. සෝපදිශේෂ නිර්වාණ ධාතුව:

   යමෙකු රහත් වූ කල ඔහුගේ භෞතික ශරීරය තවදුරටත් ඉතිරිවේ. එබැවින් 'උපාධි' සහිත යන අර්ථයෙන් ඒ පුද්ගලයා සෝපදිශේෂ නිර්වාණයට වැඩි බව කියනු ලැබේ.

2. අනුපදිශේෂ නිර්වාණ ධාතුව:

   රහතන් වහන්සේ කෙනෙකුගේ ජීවිතය අවසන් වූ පසු මතු උපතක් ඇති නොවේ. එම අවස්ථාව පිරිනිවනට පත්වීම



CamScanner

හෙවත් අනුපාදිශේෂ නිර්වාණ ධාතුවට එළඹීම නම් වේ.

★ නිවනෙහි ප්‍රධානතම ලක්ෂණ තුනකි.

1. සුඤ්ඤත ස්වභාවය:

නිවනෙහි කිසිදු ආකාරයක දෙයක් නැත. එබැවින් නිවන ශූන්‍ය වේ.

2. අනිමිත්ත ස්වභාවය:

නිවනෙහි සියලු ආකාර නිමිති ගැනීම් නැත.

3. අප්පණිහිත ස්වභාවය:

සියලු ආකාර ඇලීම් නිවනෙහි නැත.

නිවන නම් වූ ස්වභාවය සිතින් ස්පර්ශ කළ හැක්කේ අරූපාවචර ධ්‍යානලාභී උසස් මාර්ගඵල ලාභීන්ට පමණි. ඔවුන්ට අරූප ධ්‍යාන ඉක්මවා නිරෝධ සමාපත්තියට සමවැදීමෙන් 'නිවන' යන්න සැබෑවක් බව ප්‍රත්‍යක්ෂ කළ හැකිය. සෙසු අයට නිවන මේ ආකාරය යනුවෙන් සිතා ගැනීම පමණක් කළ හැකිය.

නිරෝධ සමාපත්තියට සමවැදුණු කල සිත අක්‍රිය වෙයි. ඉන් නැගී සිටි කල තමා නිවන ප්‍රත්‍යක්ෂ කළ බව වැටහෙයි.

සටහන: නිවනට උපමා දක්වන සමහර තැන්හි නිවනට පත්වීම පහන් ඇල්ලක් නිවී යෑමට සම කරනු ලැබේ. පහන් ඇල්ල නිවී ගිය පසු එය කොයි දෙසට ගියේ දැයි කීමට නොහැකිය. නිවනට පත් වූ අය ද එබඳුය.

## II වන පාඩම් මාලාව

පරමාර්ථ ධර්ම පිළිබඳ මූලික විස්තරයක් මේ දක්වා කරගෙන එන ලදී. අභිධර්මයට අදාළ තරමක් ගැඹුරු කරුණු පිළිබඳ විස්තර විභාග මෙතැන් සිට දැක්වේ.

# 15. විවිධාකාර සිත්

'චිත්ත' නම් වූ පරමාර්ථ ධර්මය මිනිස් සිතෙහි එක් පැතිකඩක් නියෝජනය කරයි. සිතෙහි විවිධාකාර තත්ත්වයන් නිරූපණය කරන 'චිත්ත' ස්වභාවයන් කිහිපයක් පහත දැක්වේ. මෙහි 'සිත්' යනුවෙන් දැක්වෙනුයේ ගතවන එක් මොහොතක ඇති වන චිත්ත ස්වභාවයකි.

1. අකුසල චිත්තය:

   ලෝභය, ද්වේෂය හෝ මෝහය (මුළාව) මුල් කරගත් සිත් අකුසල් සිත් නම් වේ.

2. කුසල චිත්තය:

   අලෝභ, අදෝෂ (අද්වේෂය), අමෝහ යන ගුණවලින් යුතු සිත් අකුසල් සිත් නොවන කුසල චිත්ත නම් වේ.

3. දෝමනස්ස සහගත සිත්:

   අප්‍රසන්න හැඟීමක් ඇති, සතුටක් නොමැති ස්වභාවය දනවන සිත් මේ නම් වේ.

4. සෝමනස්ස සහගත සිත්:

   කිසියම් අරමුණක් කැමැත්තෙන් විඳින විට මෙවැනි සිත් පහළ වේ.

5. උපේක්ෂා සහගත සිත්:

   සතුටක් හෝ දුකක් නොමැතිව අරමුණක් ගැනීමේදී උපේක්ෂා සහගත සිත් පහළ වේ.



CamScanner

6. ලෝභ මූල සිත්:

ලෝභය සහිතව ඇතිවන සිත් මේ ආකාර වේ. ආශාව, ආදරය, තෘෂ්ණාව, මසුරුකම යනාදී වචනවලින් කියවෙනුයේ ද ලෝභ ගුණයෙහි විවිධ ස්වරූපයන්ය.

7. ද්වේෂ මූල සිත්:

ආවේගය මුල්කර ගත් සිත් මේ නම් වේ. තරහව, වෛරය, නොසතුට, පිළිකුල යනාදී වශයෙන් හැඳින්වෙනුයේ ද ද්වේෂයෙහිම විවිධාකාර ස්වරූපයන්මය.

8. මෝහ මූල සිත්:

මෝහය යනු මුළාවයි. රැවටීම, මෝඩකම, නොදැනුවත්කම යනාදී වශයෙන් දැක්වෙනුයේ ද මෝහයේම විවිධාකාර ස්වරූපයන්ය. එවැනි ආකාර වූ මෝහය මුල් කරගත් සිත් මෝහ මූල සිත් නම් වේ.

පෙර කී ලෝභ මූල සිත් ද ද්වේෂ මූල සිත් ද මෝහ මූල සිත් ද අකුසල් සිත් ගණයටම වැටේ.

9. දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත සිත්:

මිථ්‍යා දෘෂ්ටියෙන් මෙහෙයවනු ලැබූ සිත් මේ නම් වේ. මෙහි මිථ්‍යා දෘෂ්ටිය යනු ධර්ම විරෝධී වූ දශවස්තුක මිථ්‍යා දෘෂ්ටිය ප්‍රමුඛ කොට ගත් හැඟීම් ය.

10. දෘෂ්ටිගත විප්‍රයුක්ත සිත්:

පෙර කී ආකාරයේ මිථ්‍යා දෘෂ්ටියක් නොගත් සිත් මේ නම් වේ. සත්ත්වයා සෝවාන් මාර්ගඵලයට පැමිණෙන තෙක්ම දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත සිත් පහළ විය හැකිය. සෝවාන් වීමත් සමගම දෘෂ්ටිය සර්වප්‍රකාරයෙන්ම ප්‍රහීණ වේ. සත්ත්වයෙකු සතර අපායෙහි හෙළීමට හැකි වනුයේ දෘෂ්ටිගත සිත්වල බලපෑමෙනි. සෝවාන් පුද්ගලයන් සතර අපායෙහි නොවැටෙනුයේ දෘෂ්ටිය ප්‍රහීණ බැවිනි.



CamScanner

11. අහේතුක සිත්:

සාමාන්‍යයෙන් සිතක් පහළ වීමට මනසින් සිදුකෙරෙන මෙහෙයවීමක් අවශ්‍යය. මනසින් මෙහෙයවීමක් නොමැතිව පහළ වන සිත් ද ඇත. ඒවා අහේතුක සිත් නම් වේ.

12. කුසල විපාක සිත්:

කුසල කර්මවල විපාක ලෙස මෙහෙයවීමක් නොමැතිව පහළ වන සිත් මේ නමින් හැඳින්වේ.

13. අකුසල විපාක සිත්:

අකුසල කර්මවල විපාක ලෙස මෙහෙයවීමක් නොමැතිව පහළ වන සිත් මේ නමින් හැඳින්වේ.

මෙකී අකුසල විපාක සිත් ද කුසල විපාක සිත් ද අහේතුක සිත් ගණයටම වැටේ.

14. ක්‍රියා සිත්:

කුසල් සිත් ද අකුසල් සිත් ද නොවන, ක්‍රියා සඳහා මනස මෙහෙයවන සිත් මේ නමින් හැඳින්වේ. පෙර කී කුසල විපාක සිත් ද අකුසල විපාක සිත් ද මෙහි කී ක්‍රියා සිත් ද අහේතුක සිත් ගණයට අයත් වේ.

15. කාමාවචර කුසල් සිත්:

දන් දීම වැනි පින්කම් කිරීමේදී සොම්නස හෝ උපේක්ෂාව සහිතව උපදින සිත් කාමාවචර කුසල් සිත් නම් වේ.

16. සහේතුක කාමාවචර විපාක සිත්:

කිසියම් කාමාවචර කුසලයක විපාක ලෙස මතු භවයේදී උපදින සිත් මේ නමින් හැඳින්වේ.

17. රූපාවචර කුසල් සිත්:

රූපාවචර ධ්‍යානවල යෙදී සිටින යෝගීන්ට ඇතිවන සිත් මේ නම් වේ.

18. රූපාවචර විපාක සිත්:

රූපාවචර ධ්‍යානවල විපාක ලෙස මතු භවයේදී ඇති වන සිත් මේ නම් වේ.

(අභිධර්ම ක්‍රමයට රූපාවචර ධ්‍යාන 5 කි. එබැවින් රූපාවචර කුසල් සිත් වර්ග 5 කට නැවත බෙදා දක්වනු ලැබේ.)

19. රූපාවචර ක්‍රියා සිත්:

සමහර අවස්ථාවලදී රහතන් වහන්සේලා ධ්‍යානගතවී සමාධි සුවයෙන් වෙසෙති. මෙවැනි අවස්ථාවලදී ඇතිවන සිත් රූපාවචර ක්‍රියා සිත් නම් වේ.

20. අරූපාවචර කුසල් සිත්:

අරූපාවචර ධ්‍යානවල යෙදී සිටීමෙන් අරූපාවචර කුසල් සිත් පහළ වේ. අරූපාවචර ධ්‍යාන 4 ක් ඇති බැවින් මෙ එක් එක් අරූපාවචර ධ්‍යානයට අදාළව වර්ග 4කට අයත් සිත් පහළ වේ.

21. අරූපාවචර විපාක සිත්:

අරූපාවචර කුසල් සිත්වල විපාක ලෙස මතු භවයෙහි පහළ වන සිත් මේ නම් වේ. එවැනි සිත් පහළ වනුයේ අරූපාවචර භවයන්හිය.

22. ලෝකෝත්තර සිත්:

සත්ත්වයන් මාර්ගඵලවලට ඔසවා තැබීම ලෝකෝත්තර සිත්වල කාර්යයයි. මාර්ග සිත් හා ඵල සිත් යනුවෙන් ලෝකෝත්තර සිත් දෙයාකාරය.

23. ලෝකෝත්තර මාර්ග සිත්:

මාර්ගඵල ලැබීමට මොහොතකට පෙර ලෝකෝත්තර මාර්ග සිත් ඇති වේ.

★ සෝවාන් මාර්ග චිත්තය

★ සකෘදාගාමී මාර්ග චිත්තය

★ අනාගාමී මාර්ග චිත්තය

★ අර්හත් මාර්ග චිත්තය

වශයෙන් මාර්ග සිත් 4 කි. මේ සිත් එක් අයෙකුට ඇති වනුයේ එක් වරකි. එමෙන්ම ඒ මාර්ග සිත් ඇති වනුයේ මාර්ගඵලයට එළඹීමට ඉතා සුළු මොහොතකට පෙරය.

24. ලෝකෝත්තර ඵල සිත්:

ලෝකෝත්තර මාර්ග සිත්වල විපාක ලෙස ලෝකෝත්තර ඵල සිත් ඇති වේ. ලෝකෝත්තර ඵල සිත ඇති වන්නේ ලෝකෝත්තර මාර්ග සිතට වහාම අනතුරුවය. ලෝකෝත්තර ඵල සිත දෙවරක් හෝ තෙවරක් පිට පිට ඇති වී නිරුද්ධ වෙයි. මේ ආකාරයට,

★ සෝවාන් ඵල චිත්තය

★ සකෘදාගාමී ඵල චිත්තය

★ අනාගාමී ඵල චිත්තය

★ අර්හත් ඵල චිත්තය

වශයෙන් ලෝකෝත්තර ඵල සිත්වල ආකාර 4 කි. මාර්ග ඵල ලත් යෝගියාට අවශ්‍ය නම් උත්සාහ කර නැවත නැවතත් ලෝකෝත්තර ඵල සිත් උපදවා ගත හැකිය. ලෝකෝත්තර ඵල සිත් එක දිගට ඇති වන විට ඵල සමාපත්තිය යැයි කියනු ලැබේ. මේ ආකාරයට මාර්ගඵල සමාපත්ති 4ක් එක් එක් මාර්ගඵලයට අදාළව ඇත. මෙහි ඵල චිත්තයන් ද ඵල සමාපත්ති චිත්තයන් ද නිවන අරමුණු කොට ඇති වේ.

# 16. චෛතසික විග්‍රහය

අභිධර්ම ක්‍රමය අනුව මිනිස් සිතෙහි මූලික කොටස් දෙකකි. ඒවා 'චිත්ත' සහ 'චෛතසික' යනුවෙන් දෙයාකාරය. 'චිත්ත' නම් වූ පරමාර්ථ ධර්මය පිළිබඳ සෑහෙන විස්තරයක් මීට ඉහත පරිච්ඡේදයෙහි අඩංගු විය. විවිධාකාර චෛතසිකයන් පිළිබඳව මෙතැන් සිට විස්තර කෙරෙයි.



CamScanner

## 17. සර්ව චිත්ත සාධාරණ චෛතසික

මේවාට 'සබ්බ චිත්ත සාධාරණ චෛතසික' යන නම ද යෙදේ. අභිධර්ම ක්‍රමය අනුව සිත වහ වහා ඉපිද නැසී යයි. මේ සෑම සිත් පෙළකම අඩංගු 'සිත්' සමග අනිවාර්යයෙන්ම උපදින චෛතසික ධර්ම හතක් (7) ඇත්තේය. සර්ව චිත්ත සාධාරණ චෛතසික යනු ඒවාට කියන පොදු නමයි. සර්ව චිත්ත සාධාරණ චෛතසික හත පහත පරිදි වේ.

1. ස්පර්ශ (ඵස්ස):

   අරමුණ සිතෙහි හැඟීම ස්පර්ශ හෙවත් ඵස්ස නම් වේ. සැබැවින්ම ඵස්ස යනු 'දැනීම' හා සම්බන්ධ චෛතසිකයකි.

2. වේදනා:

   අරමුණෙහි රසවිඳීම වේදනා නම් වේ. සැප, දුක් හෝ උපේක්ෂා සහගත බව ඇති කරනුයේ වේදනාවෙනි.

3. සංඥා:

   අරමුණ හැඳින ගැනීම සංඥා නම් වේ. මේ 'සත්ත්වයෙකි' මේ 'මිනිසෙකි' ආදී ලෙස යමක් වෙන් කොට හඳුනා ගනුයේ සංඥා චෛතසිකයෙනි.

4. චේතනාව:

   චේතනාව යනු කිසියම් උත්සාහයක් හෙවත් සිතින් කරන විධානයකි. කිසියම් ක්‍රියාවක මූලාරම්භය ඇති කිරීම චේතනාවට අයත් කාර්යයයි. මතු විපාක දෙන කර්මය උපදිනුයේ ද චේතනාව ආශ්‍රයෙනි. 'චේතනාව යනු කර්මයයි' කියනුයේ එබැවිනි.

5. ඒකාග්‍රතා:

   සිත අරමුණෙහි රඳවා ගැනීම ඒකාග්‍රතා චෛතසිකයේ කාර්යයයි. ඒකාග්‍රතාව අඩු වූ විට සිත විසිරී යයි. ඒකාග්‍රතාව වඩාත් දියුණු වූ කල සිත සමාධිගත වී යැයි කියනු ලැබේ.

6. ජීවිතේන්ද්‍රිය:

චිත්ත, චෛතසික පරම්පරාව නොසිඳී පවත්වා ගැනීම ජීවිතේන්ද්‍රියට අයත් කාර්යයයි. ජීවිතේන්ද්‍රිය චෛතසිකයක් වන නමුත් අනෙක් චෛතසික මෙන් එය ප්‍රකට නොවේ.

7. මනසිකාර:

යමක් සිතෙන් විමසා බැලීම මනසිකාර නම් වේ.

## 18. ප්‍රකීර්ණක චෛතසික

පෙර කී චෛතසිකවලට වඩා වෙනස් චෛතසික ධර්ම හයක් (6) ප්‍රකීර්ණක චෛතසික යනුවෙන් හැඳින්වේ. ප්‍රකීර්ණක චෛතසික පිළිබඳ විස්තර මෙසේය.

1. විතර්ක (විතක්ක):

සිතට අරමුණක් නැංවීම විතර්ක නම් වේ.

2. විචාර:

අරමුණෙහි ස්වභාවය සිතින් විමසා බැලීම විචාර නම් වේ.

3. අධිමෝක්ෂ (අධිමොක්ඛ):

සිතෙන් අරමුණ පිළිබඳ විනිශ්චයක් දීම අධිමෝක්ෂ නම් වේ.

4. විරිය (වීර්යය):

කාර්යයක් ඉදිරියට කරගෙන යාමේ ධෛර්යය ද චෛතසිකයකි. එය වීර්යය නම් වේ.

5. ප්‍රීති (පීති):

සිත පිනවන ස්වභාවය ප්‍රීති නම් වේ.

6. ඡන්දය:

ඡන්දය යනු කිසියම් කාර්යයක් කිරීමට ඇති කැමැත්තයි.

7. අන්‍ය සමාන චෛතසික:

කුසල, අකුසල යන දෙපක්ෂයටම පොදු වූ චෛතසික අන්‍ය සමාන චෛතසික නම් වේ. අන්‍ය සමාන චෛතසික 13 කි. ඒවා නම්,

1. සර්ව චිත්ත සාධාරණ චෛතසික - 7
2. ප්‍රකීර්ණක චෛතසික - 6

13

# 19. අකුසල චෛතසික

අකුසල් සිත්හි පමණක් යෙදෙන චෛතසික, අකුසල චෛතසික නම් වේ. අකුසල චෛතසික 14 කි. ඒවා පහත දැක්වේ.

1. මෝහ:

මුළා වීම, වරදවා වටහා ගැනීම, සත්‍යය නොදැනීම යන ස්වභාවයන්ට මෝහය යයි කියනු ලැබේ.

2. අහිරික:

පාපයට ඇති කැමැත්ත අහිරික නම් වේ.

3. අනොත්තප්පය:

පව් කර පසුනොතැවී සිටීම අනොත්තප්පයයි.

4. උද්දච්ඡය:

සිත නානා අරමුණු කෙරේ විසිරී යාම උද්දච්ඡයයි.

5. ලෝභය:

අරමුණු කෙරෙහි සිතෙහි ඇති වන ඇල්ම ලෝභ නම් වේ.

6. දිට්ඨි:

කිසියම් වැරදි විශ්වාසයක් මත රඳා සිටීම දිට්ඨි නම් වේ.

7. මාන:

මම වෙමිය, මේ මමය යන හැඟීම ද තමා හා අනුන් ඒ අනුව සසඳා බැලීම ද මාන නම් වේ.

8. දෝස (ද්වේෂ):

තරහව ද්වේෂ හෙවත් දෝස නම් වේ.

9. ඉස්සා (ඊර්ෂ්‍යා):

අනුන්ගේ සැපත නොරිසි වීම ඊර්ෂ්‍යා හෙවත් ඉස්සා නම් වේ.

10. මච්ඡරිය:

තමා සතු දෙයක් අනුන්ට දීමේ නොකැමැත්ත.

11. කුක්කුච්ච (කුකුස):

තමා කළ වැරදි හා පව්කම් ගැන පසුතැවීම.

12. ථීනය:

ථීන යනු අලස බවයි.

13. මිද්ධ:

මිද්ධ යනු වැඩිපුර ආහාර ගෙන සිටින විට ඇතිවන මත් ගතියයි. (බත්මත යැයි ද කියනු ලැබේ.)

14. විචිකිච්ඡා:

සිතෙහි හටගන්නා සැකය විචිකිච්ඡාවයි. බුද්ධාදී අටතැන් පිළිබඳ සැකය අකුසල පක්ෂයට අයත් විචිකිච්ඡාවයි.



CamScanner

## 20. ශෝභන සාධාරණ චෛතසික

කුසල් සිත්හි පමණක් ඇතිවන චෛතසික ධර්මයන්ට ශෝභන සාධාරණ චෛතසික යන නම යෙදේ. මේවා කිසි විට අකුසල් සිත්හි නොයෙදේ. ශෝභන සාධාරණ චෛතසික ගණනින් 19 කි. ඒවා පහත දැක්වෙන පරිදි විභාග කළ හැකිය.

1. සද්ධා (ශ්‍රද්ධාව):

   බුදුන්, දහම් හා සඟුන් යන තෙරුවන් කෙරෙහි ඇතිවන පැහැදීම ශ්‍රද්ධා නම් වේ.

2. සති:

   සිහි නුවණ මනාව පිහිටුවා ගැනීම සති නම් වේ.

3. හිරි:

   පව්කම්හි යෙදීමට ලජ්ජා වන ස්වභාවය හිරි නම් වේ.

4. ඔත්තප්ප:

   පව් කිරීමට ඇති බිය ඔත්තප්ප නම් වේ.

5. අලෝභ:

   පරිත්‍යාගශීලී බව අලෝභ නම් වේ.

6. අදෝස (අද්වේෂය):

   ද්වේශ නොකර, මෙත් සිතෙන් යුතුව සිටීම අදෝස නම් වේ.

7. තත්‍රමජ්ඣත්තතා:

   සිතෙහි ක්‍රියාකාරිත්වය නිසි ලෙස පවත්වා ගැනීම මේ නම් වේ.

8. කායපස්සද්ධි:

   කයෙහි සංසිඳුණු ස්වභාවය සිතට දැනීම මෙයින් අදහස් වේ.

9. චිත්ත පස්සද්ධි:

සිතෙහි සංසිඳුණු ස්වභාවය මෙයින් අදහස් වේ.

10. කාය ලහුතා:

කයෙහි සැහැල්ලු බව මෙයින් අදහස් වේ.

11. චිත්ත ලහුතා:

සිතෙහි සැහැල්ලු බව සිතට දැනීම මෙයින් අදහස් වේ.

12. කාය මුදුතා:

කයෙහි මුදු බව සිතට දැනීම මෙයින් අදහස් වේ.

13. චිත්ත මුදුතා:

සිතෙහි මුදු බව මෙයින් අදහස් වේ.

14. කාය කම්මඤ්ඤතා:

කයෙන් වැඩ ගත හැකි යයි සිතට දැනීම කාය කම්මඤ්ඤතා නම් වේ.

15. චිත්ත කම්මඤ්ඤතා:

සිතෙන් වැඩ ගත හැකි ගතිය හෙවත් කර්මණ්‍යතාව මෙයින් අදහස් වේ.

16. කාය පාගුඤ්ඤතා (ප්‍රගුණතාව):

කයෙහි හුරු බව හිතට දැනීමයි.

17. චිත්ත පාගුඤ්ඤතා:

සිතෙහි හුරු බවයි.

18. කායුජ්ජුකතා:

කයෙහි ඍජු ගතිය සිතට දැනීමයි.

19. චිත්තුජ්ජුකතා:

සිතෙහි ඍජු ගතියයි.



CamScanner

## 21. අසාධාරණ ශෝභන චෛතසික

සිත පිරිසිදු භාවයට පත් කරවන, උසස් භාවයට පත් කරවන චෛතසික මේ ගණයට වැටේ. අසාධාරණ ශෝභන චෛතසික ධර්ම සයකි.

1. සම්මා වාචා:

   බොරු, කේලාම්, පරුෂ වචන හා හිස් වචන හැර අනෙක් දේ පමණක් කතා බහ කිරීමට අදාළ චෛතසික ධර්මයකි.

2. සම්මා කම්මන්ත:

   සතුන් මැරීම, හොරකම් කිරීම හා කාමයේ වරදවා හැසිරීමෙන් වැළකීම සිදු කරන චෛතසික ධර්මයකි.

3. සම්මා ආජීව:

   වැරදි ජීවන රටාවන්ගෙන් වළකන චෛතසික ධර්මයකි.

4. කරුණා:

   අනුන්ගේ දුක ගැන අනුකම්පාව ඇතිවීම.

5. මුදිතා:

   අනුන් සතුටින් සිටිනු දැකීමට කැමති වීම.

6. ප්‍රඥා:

   ලෝකයෙහි යථා තත්ත්වය දන්නා ස්වභාවය ප්‍රඥා නම් වේ.



CamScanner

# 22. අභිධර්මයෙහි එන 'ක්ෂණවාදය'

'ක්ෂණය' යන්නෙන් ඉතා කුඩා මොහොතක් අර්ථ දැක්වේ. පරමාර්ථ ධර්මයන් වන චිත්ත, චෛතසික හා රූප යන තුනම නැවත නැවතත් ඉපදෙමින් බිඳී බිඳී යන බව අභිධර්මයේ ඉගැන්වේ. සමහර ථේරවාදී ගුරුකුල තුළ ද මහායානයේ ද ක්ෂණවාදය පිළිගනු නොලැබේ. සමහරුන්ගේ මතය වී ඇත්තේ ක්ෂණවාදය ලක්දිව ථේරවාදී ගුරුකුලය තුළින් බිහි වූ නව අදහසක් බවයි.

සිතක් පවතින සුළු කාලසීමාව 'චිත්තක්ෂණයක්' නම් වේ. 'චිත්තක්ෂණය' යනු තත්පරයකටත් වඩා කුඩා කාල සීමාවකි. සෑම හිතකම,

1. උත්පාද
2. ස්ථිති
3. භංග

නමින් අවස්ථා 3 ක් ඇත. උත්පාද අවස්ථාවේදී සිත ඉපදෙයි, ස්ථිති අවස්ථාවේදී සිත පවතියි, භංග අවස්ථාවේදී සිත නැසෙයි. මේ ක්‍රියාවලිය නැවත නැවතත් වේගයෙන් සිදුවේ. එම වේගය කෙතරම් අධික ද යත් සිත ඉපදෙමින්, පවතිමින්, නැසෙමින් සිදුවන ක්‍රියාවලිය බොහෝ දෙනෙකුට නොවැටහේ.

මෙම ක්‍රියාවලිය උදාහරණයකින් පැහැදිලි කළ හැකිය. අප චිත්‍රපටියක් බලන විට එම චිත්‍රපටියේ අප දකින රූප චලනය වන බව අපට හැඟේ. එනමුත් සිදුවන්නේ අනෙකකි. එකිනෙකට යන්තමින් වෙනස් රූප රාමු පෙළක් එක පසු එක තිරය මත දිස්වේ. එය පියවි ඇසට පෙනෙනුයේ සැබෑ චලනයක් මෙනි.

සිත මෙන්ම සිතට ගෝචර වන රූප ද ඉපිද පැවතී බිඳී යයි. මේ ක්‍රියාවලිය ද වේගයෙන් සිදුවන බැවින් සෑම දෙයක්ම සැබෑවට පවතින බව අපට පෙනේ. එනමුත් සැබෑවට සිදුවන්නේ

රූපයේ කුඩා කුඩා කොටස් වේගයෙන් ඉපදෙමින් බිඳී බිඳී යාමයි.

මේ ක්‍රියාවලියට කදිම උදාහරණයක් බෞද්ධ ආචාර්යවරු දක්වති. රත් කරන ලද කිරි හැළියක් උතුරා යන විට එහි ඇති කිරි, බුබුළු දමද්දී නිරතුරුවම එම බුබුළු පිපිරී යයි. මෙය හොඳින් දැකගත හැක්කේ ළඟ සිට නිරීක්ෂණය කරන අයට පමණි. දුර සිට බලන අයට බුබුළු දමන ආකාරයත්, ඒවා පිපිරී යන ආකාරයත් නොපෙනේ. අපේ ශරීරයත් මෙවැනි පෙණ පිඬුවලට උපමා කළ හැකිය. ශරීරය තැනී ඇති කුඩා අංශු ඉතා වේගයෙන් ඉපිද, පැවතී නැසේ. මිනිසාගේ ඉන්ද්‍රියයන් මෙම තත්ත්වය ග්‍රහණය කරගත නොහැකි නිසා හැම දෙයක්ම ඇති බව හැඟේ.

## 23. 'චිත්ත වීථි' ක්‍රමය

සිත් ඉපදීම, පැවතීම හා නැසී යාම සිදු වනුයේ ක්‍රමානුකූල අනුපිළිවෙළකටය. එම අනුපිළිවෙළ විස්තර කරන ක්‍රමය චිත්ත වීථි නම් වේ. සෑම චිත්ත වීථියකම උත්පාද, ස්ථිති, භංග නම් අවස්ථා තුන සහිත කුඩා කුඩා සිත් යම් නිශ්චිත ප්‍රමාණයක් පවතී. චිත්ත වීථි දෙකක් අතර ඇති වන ඉතා කුඩා කාල පරතරවලට 'භවංග සිත්' යන නම යෙදේ. චිත්ත වීථි ඇති වනුයේ කිසියම් අරමුණක් සිතෙහි ගැටී භවංග සිත කම්පනයට පත්වීමෙනි.

උපත, මරණය, මාර්ගඵල ලැබීම ආදී අවස්ථා ගැඹුරින් විස්තර කිරීමට චිත්ත වීථි ක්‍රමය බහුලව උපයෝගී කරගනු ලැබේ.

මෙකී චිත්ත වීථි ක්‍රමය ද ක්ෂණවාදය මත පදනම් වූවකි.

## 24. රූප විභාගය

චිත්ත හා චෛතසික යන සිතට අදාළ පරමාර්ථ ධර්මයන්ට ගෝචර වන දේ රූප නම් වේ. රූප නම් වන පරමාර්ථ ධර්ම විවිධ ආකාර රාශියක් ගනී. මෙහි පහත දැක්වෙනුයේ රූප පිළිබඳ මූලික විග්‍රහයයි.

<u>මහා භූත රූප</u>

මහා භූත රූප යනු අප අවට පරිසරයේ ඇති විවිධාකාර වූ දේ ද අපගේ ශරීරය ද නිර්මාණය වී ඇති ඝන, ද්‍රව, වායු යන ශක්තීන්ගේ ගතිගුණයි. එවැනි මහා භූත රූප 4 කි.

- ★ පඨවි ධාතුව: තද ගතිය යනු පඨවි ධාතුවයි. ඝන ද්‍රව්‍යවල පඨවි ගුණය අධිකය.
- ★ ආපෝ ධාතුව: වැගිරෙන සුලු ස්වභාවයට ආපෝ ධාතුව යනුවෙන් කියනු ලැබේ. වතුර, තෙල් වැනි වැගිරෙන සුලු දියරයන්හි ආපෝ ගුණය අධිකය.
- ★ තේජෝ ධාතුව: උණුසුම යනු තේජෝ ධාතුවයි. ගින්නෙහි තේජෝ ධාතුව වඩාත්ම ප්‍රකටය.
- ★ වායෝ ධාතුව: විසිරී යන ස්වභාවයට වායෝ ධාතුව යන නම යෙදේ. සුළඟෙහි සහ වාතයෙහි වායෝ ධාතුව අධිකය.

මෙහිදී සැලකිය යුතු වැදගත් කරුණක් වනුයේ සෑම දෙයකම සෑම ද්‍රව්‍යයකම මෙකී ගුණ හතර අඩු වැඩි වශයෙන් පවතින බවයි. යමක එකී ගුණ හතරෙන් එකක් වඩා ප්‍රකට වේ නම්, ඒ ගුණයට සරිලන ලෙස එම දෙය හැසිරෙයි. ජලයෙහි ආපෝ ගුණය අධික බැවින් ජලය වැගිරෙයි. සූත්‍ර පිටක ක්‍රමය අනුව විස්තර කිරීමේදී පඨවි යනු තද දෙයකි. ආපෝ යනු ද්‍රවයන්ය. තේජෝ යනු උණුසුමයි. වායෝ යනු වාතයයි. අපගේ ශරීරය සතර මහා භූතයන්ගෙන් හැදුණු එකක් යනුවෙන් විස්තර කරනු ලබන්නේ මේ හතරාකාරයේම දේ ශරීරය තුළ පවතින බැවිනි. ඇටකටු හා මස් යනාදිය පඨවි ධාතු ද, අප ශරීරයේ



CamScanner

ඇති තෙල් හා ලෙය ආපෝ ධාතුව ද, ශරීරයේ තැන් තැන්වල එක් රැස් වී ඇති වාතය වායෝ ධාතුව ද, සිරුරෙහි උණුසුම තේජෝ ධාතුව ද නියෝජනය කරයි. කෙසේ නමුත් අභිධර්ම ක්‍රමය අනුව විස්තර කිරීමේදී පඨවි, ආපෝ, තේජෝ සහ වායෝ යනු විවිධාකාර ගුණ හතරකි.

## ප්‍රසාද රූප

අපගේ පංචේන්ද්‍රියන්හි ඇති අරමුණු අල්ලා ගන්නා, අරමුණු පිළිගන්නා සංවේදී කොටස්වලට ප්‍රසාද රූප යන වදන යෙදේ. මෙවැනි ප්‍රසාද රූප 5 කි.

1. චක්ඛු ප්‍රසාද:

   ඇසේ ඇති රූපවලට සංවේදී කොටස් චක්ඛු ප්‍රසාද නම් වේ. එක් ආචාර්ය මතවාදයකින් කියවෙනුයේ ඇසෙහි කළු ඉංගිරියාව මැද උකුණු හිසක් පමණ ප්‍රදේශයක චක්ඛු ප්‍රසාදය පිහිටා ඇති බවයි. (කෙසේ වෙතත්, ඇස පත්ලේ ඇති දෘෂ්ටි විතානය නම් පෙදෙසෙහි ආලෝක සංවේදී සෛල පිහිටන බව නූතන කාය විච්ඡේද විද්‍යාව අනුව පිළිගනු ලැබේ. එබැවින් චක්ඛු ප්‍රසාදය යන්නෙන් දෘෂ්ටි විතානය (Retina) අදහස් කළා විය හැකිය.)

2. ශ්‍රෝත්‍ර ප්‍රසාදය:

කනෙහි ඇති ශබ්දයට සංවේදී පෙදෙස ශ්‍රෝත්‍ර ප්‍රසාදය නම් වේ. කන පතුලෙහි කන් බෙරයට යටින් පිහිටි මුද්දක් වැනි වූ ද ලෝම සහිත වූ ද පෙදෙසක ශ්‍රෝත්‍ර ප්‍රසාදය පවතින බව අභිධර්ම ආචාර්යවරුන්ගේ මතයයි. (මෙම මතය නූතන කාය විච්ඡේද විද්‍යාවට ද එකඟය. සියුම් ලොම් සහිත සර්පිලාකාර ව්‍යුහයක් වන කර්ණ ශංඛය නම් නළය කන තුළ ඇති ශබ්දයට සංවේදී පෙදෙසයි.)

3. ජිව්හා ප්‍රසාදය:

දිවෙහි ඇති රසයට සංවේදී ප්‍රදේශයයි. දිව මැද මානෙල් මල් පෙත්තක අග කොටස බඳු ස්ථානයක ජිව්හා ප්‍රසාදය

පවතින බව ආචාර්ය මතයකි. (කෙසේ නමුත් සූත්‍ර පිටක ක්‍රමය අනුව දිවෙහි ඇති රස අංකුරවල ගැටීමෙන් රසය උපදින බව විස්තර කර ඇත.)

4. ඝාන ප්‍රසාදයː

නාසයේ ගඳ හා සුවඳට සංවේදී වන පෙදෙස ඝාන ප්‍රසාදයයි. නාසය තුළ පිහිටි එළු කුරයක හැඩය ගත් ව්‍යුහයක ඝාන ප්‍රසාදය පිහිටන බව ආචාර්ය මතයයි.

5. කාය ප්‍රසාදයː

කයෙහි ඇති සංවේදී ස්ථානවල කාය ප්‍රසාදය පිහිටා ඇත. අනෙකුත් ප්‍රසාද රූප මෙන් නොව කෙස්, ලොම්, නිය වැනි ස්ථාන හැර අනෙක් ස්ථානවල කාය ප්‍රසාද රූප පිහිටයි.

<u>ගෝචර රූප</u>

මෙකී ප්‍රසාද රූපවලට ගෝචර වන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශයන්ට ගෝචර රූප යන නම යෙදේ.

<u>රූප කලාප</u>

රූප කොටස් එක්තැන් වීමෙන් රූප කලාප සැදේ. රූපයක් පැවතිය හැකි සූක්ෂම ආකාර මෙයින් අදහස් වේ. උදාහරණ ලෙස රූප අෂ්ටක කලාපය යනු,

1. පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ගුණ සතර

2. වර්ණ, ගන්ධ, රස, ඕජා යන රූප හතරද එකට ඇති රූප කලාපයකි. මේ ආකාර රූප කලාප විශාල ප්‍රමාණයක විස්තර අභිධර්මයේ දක්වා ඇත.

## 25. ප්‍රත්‍ය පිළිබඳ විස්තරය

විවිධාකාර හේතු, ප්‍රත්‍යයන් පිළිබඳව දීර්ඝ විස්තර දැක්වෙනුයේ අභිධර්මයට අයත් පට්ඨාන ප්‍රකරණයෙහිය. මෙලොව ඇති සෑම දෙයක්ම කිසියම් හේතු ප්‍රත්‍යයක් මත බිහිවී හේතු ප්‍රත්‍ය මත පවතී. ඒ පිළිබඳ විස්තරය ප්‍රත්‍ය විභාගය නම් වේ. මූලික අභිධර්මයට අයත් ප්‍රත්‍ය විභාගය මතු දැක්වේ.

1. හේතු ප්‍රත්‍යඃ

යමක් හේතු කොට ගෙන තවෙකක් පැවතීම හේතු ප්‍රත්‍යයෙන් විස්තර කෙරෙයි.

2. ආරම්මණ ප්‍රත්‍යයඃ

හිත අරමුණු ගැනීම ස්වභාවය කොට පවතී. සිත පවතිනේ ද අරමුණු ප්‍රත්‍ය කර ගැනීමෙනි. මෙම කරුණ ආරම්මණ ප්‍රත්‍යය නම් වේ.

3. අධිපති ප්‍රත්‍යයඃ

යමක ක්‍රියාකාරීත්වය සීමා කෙරෙනුයේ කිසියම් ධර්මතා හේතුවෙනි. එවැනි ධර්මතාවන් අධිපති ප්‍රත්‍යයෙහිලා සැලකේ.

4. අනන්තර ප්‍රත්‍යය සහ 5. සමන්තර ප්‍රත්‍යයඃ

හිත නොනැවතීම ක්‍රියාකාරී වේ. එක සිතක් හටගෙන, නැවතී නිරුද්ධ වූ වහාම තව සිතක් උපදී. ඉදිරියේ ඇති වන සිතට ප්‍රත්‍ය වනුයේ පෙර පැවති හිතයි. මේ කරුණු අනන්තර හා සමන්තර ප්‍රත්‍යවලින් විස්තර කෙරෙයි.

6. සහජාත ප්‍රත්‍යයඃ

සමහර දේ හටගනුයේ එකටය. එලෙස එකට හටගන්නා වූ ධර්මතාවන් විස්තර කිරීමට සහජාත ප්‍රත්‍යය යොදා ගනු ලැබේ.



CamScanner

7. අන්‍යෝන්‍ය ප්‍රත්‍යය:

සමහර දේ එකිනෙකට ආධාර කොට පවතී. එවැනි දේ විස්තර කිරීමට අන්‍යෝන්‍ය ප්‍රත්‍යය යෙදේ.

8. නිශ්‍රය ප්‍රත්‍යය:

සමහර දේ තවත් දේක අනුග්‍රහයෙන් පමණක් පවතී. එම අවස්ථාව නිශ්‍රය ප්‍රත්‍යයෙන් විස්තර කෙරෙයි.

9. උපනිශ්‍රය ප්‍රත්‍යය:

යමක් තවෙකකට උපකාරී වීම මෙයින් අදහස් වේ.

10. පුරේජාත ප්‍රත්‍යය:

පසුව උපදනා දෙයකට උපකාරී වන ධර්මතාවන් මෙයින් අදහස් වේ.

11. ප්‍රශ්චාජ්ජාත ප්‍රත්‍යය:

පසුව ඉපදෙන නමුත්, කලින් උපන් දෙයකට උපකාරී වන ධර්මතාවන් මෙයින් අදහස් වේ.

12. ආසේවන ප්‍රත්‍යය:

යමකට බලවත්වීමට උපකාරී වන ධර්මතාවක් මෙයින් අදහස් වේ.

13. කර්ම ප්‍රත්‍යය:

චේතනාව නිසා ක්‍රියාව හටගැනීම මෙයින් අදහස් වේ.

14. විපාක ප්‍රත්‍යය:

නිරුත්සාහීව යමකට ඉපදීමට ආධාර වන දෙය විපාක ප්‍රත්‍යයෙන් අදහස් වේ.

15. ආහාර ප්‍රත්‍යය:

යමක පැවැත්මට උපකාරී වන ආහාර ලෙස සැලකිය හැකි දෙය මෙයින් අදහස් වේ.

16. ඉන්ද්‍රිය ප්‍රත්‍යය:

යමක් වසඟයෙන් පවත්වා ගන්නා ධර්මතාවක් මෙයින් අදහස් වේ.

17. ධ්‍යාන ප්‍රත්‍යය:

උත්සාහයෙන් උපදවන දේ සම්බන්ධව ධ්‍යාන ප්‍රත්‍යය යෙදෙයි.

18. මාර්ග ප්‍රත්‍යය:

සත්ත්වයා පහසුවට හෝ පරිහානියට පමුණුවන දේ මාර්ග ප්‍රත්‍යයෙන් අදහස් වේ.

19. සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය:

එකිනෙක සම්මිශ්‍රණය වීමේ ස්වභාවය මෙයින් අදහස් වේ.

20. විප්‍රයුක්ත ප්‍රත්‍යය:

එකිනෙක මිශ්‍ර නොවී පැවතීමට ඇති හැකියාව විප්‍රයුක්ත ප්‍රත්‍යයෙන් අදහස් වේ.

21. අස්ති ප්‍රත්‍යය:

එක් දෙයක් ඇතිවීම, තවත් දෙයක් තිබීම සහතික කරවයි නම් ඒ ස්වභාවය අස්ති ප්‍රත්‍යය නම් වේ.

22. නාස්ති ප්‍රත්‍යය:

එක් දෙයක් ඇති තැන යම් වෙනත් දෙයකට පැවතිය නොහැකි නම් ඒ ස්වභාවය නාස්ති ප්‍රත්‍යය නම් වේ.

23. විගත ප්‍රත්‍යය සහ 24. අවිගත ප්‍රත්‍යය:

එක් දෙයක් ඇතිවීමෙන් තව දෙයක් ඇතිවීමට ඉඩ සැලසීම මෙයින් අදහස් වේ.

සටහන: මෙම විස්තරය සූවිසි ප්‍රත්‍යය නම් වේ. මේ ආකාරයට චිත්ත, චෛතසික හා රූප යන පරමාර්ථ ධර්ම එකිනෙක ප්‍රත්‍ය කරගනිමින් පැවතීම නිසා සත්ත්වයන්, පුද්ගලයන් හා ද්‍රව්‍ය ඇති බව ද යම් යම් ක්‍රියා සිදුවන බව ද වැටහෙයි.

# 26. ප්‍රඥප්ති ධර්ම සහ පරමාර්ථ ධර්ම

චිත්ත, චෛතසික, රූප හා නිර්වාණ යන සතරාකාර ධර්මතාවන් සැබෑ ලෙසම පවතින බව අභිධර්ම ඉගැන්වීමයි. මෙකී කරුණු පරමාර්ථ ධර්ම නම් වේ. පරමාර්ථ ධර්ම හැර ඉතිරි සියලු දෙය මිනිසා විසින් පවත්වා ගත් ඒවා ප්‍රඥප්ති ධර්ම නම් වේ. ප්‍රඥප්ති ධර්ම ද පහත සඳහන් පරිදි නැවත වර්ග කළ හැකිය.

1. විද්‍යමාන ප්‍රඥප්ති ධර්මඃ

ස්පර්ශය, වේදනාව වැනි මූලික ස්වරූපයේ ධර්මතා ප්‍රඥප්තීන් වුව ද ඒවා සැබැවින්ම විද්‍යමානය.

2. අවිද්‍යමාන ප්‍රඥප්ති ධර්මඃ

මිනිසා, පුටුව, ස්ත්‍රිය වැනි දේ අප විසින්ම පවත්වා ගත් දේය. එමෙන්ම ඒවා මූලික ස්වරූපයන් ද නොවේ. එබැවින් එවැනි දේ අවිද්‍යමාන ප්‍රඥප්ති ධර්ම නම් වේ. (විද්‍යමාන හා අවිද්‍යමාන දේ අතර සාපේක්ෂ වෙනස වටහා ගැනීමෙන් උසස් මාර්ගඵල ලැබීමට පහසු වෙන බව සූත්‍ර පිටකයේ සතිපට්ඨාන සූත්‍රයෙහි දැක්වේ. එනම්, හැඟීම්, දැනීම්, වේදනා ආදිය පමණක් යථාර්ථ වශයෙන් පවතින බවත්, සත්ත්වයෙකු, පුද්ගලයෙකු හෝ ආත්මයක් කියා දෙයක් යථාර්ථ වශයෙන් නොපවතින බවත් නුවණින් විමසා අවබෝධ කර ගන්නා පුද්ගලයා උසස් මාර්ග ඵලයන්ට ක්‍රම ක්‍රමයෙන් ළඟා වන බවත්ය.)

## 27. භූමි පිළිබඳ විස්තර විභාග

සත්ත්වයාගේ මරණය හා පුනරුත්පත්තිය පිළිබඳ ගැඹුරු විග්‍රහයන් අභිධර්මයෙහි හමුවේ. අභිධර්ම ඉගැන්වීමට විශේෂයෙන් සකස් කළ පුරාණ ග්‍රන්ථයක් වන 'අභිධර්මාර්ථ සංග්‍රහයෙහි' මරණය හා පුනර්භවය පිළිබඳව අභිධර්මය ආශ්‍රිත ඉගැන්වීම් රාශියක් අඩංගුය. අභිධර්මාර්ථ සංග්‍රහයෙහි 5 වන පරිච්ඡේදයෙහි ඇතුළත් එවැනි ඉගැන්වීම් සමූහයක් මෙතැන් සිට දැක්වේ.

★ සතර අපාය, කාම සුගති භූමි, රූපාවචර භූමි සහ අරූපාවචර භූමි වශයෙන් සත්ත්වයා උපදින ස්ථාන සතරාකාරය.

★ නරකය, තිරිසන් අපාය, ප්‍රේත උපත්, අසුර නිකාය වශයෙන් අපාය ද සිව් වැදෑරුම් ආකාර ගනී.

★ කාම සුගති භූමි හතකි. මිනිස් ලොව ද, චාතුර්මහාරාජිකය, තාවතිංසය, යාමය, තුෂිතය, නිර්මාණරතිය සහ පරනිර්මිත වශවර්තිය යන සදෙව් ලොව ද කාම සුගති භූමීන්ය.

★ සතර අපායත්, මිනිස් ලොවත්, සදෙව් ලොවත් එකට ගත් විට කාමාවචර භූමි 11 ක් පවතී. (කාමාවචර භූමි යනු කම් සැප සොයන සත්ත්වයන්ගේ වාසස්ථානයි. මෙවා සමහරෙක සැපත් තවෙකෙක සැප, දුක මිශ්‍රවත් අනෙකක දුක පමණක් ද ඇත.)

★ ප්‍රථම ධ්‍යාන ලද්දවුන් උපදින බ්‍රහ්ම ලෝක තුනකි.

1. බ්‍රහ්ම පාරිෂද්‍යය
2. බ්‍රහ්ම පුරෝහිතය
3. මහා බ්‍රහ්මය ප්‍රථම ධ්‍යාන භූමීන් වේ.

★ ද්විතීය ධ්‍යානය ලද්දවුන් උපදින භූමීන් තුනකි.

1. පරිත්තාභය
2. අප්පමාණාභය

3. ආභස්සරය යනු ද්විතීය ධ්‍යාන භූමීන් වේ.

★ තෘතීය ධ්‍යානය ලද්දවුන් උපදින භූමීන් තුනකි.

1. පරිත්තසුභ
2. අප්පමාණ සුභ
3. සුභකිණ්හ යනු තෘතීය ධ්‍යාන භූමීන් වේ.

★ චතුර්ථ ධ්‍යානය ලද්දවුන් උපදින භූමීන් තුනකි.

1. වේහප්ඵලය
2. අසඤ්ඤසත්තය
3. සුද්ධාවාසය යනු චතුර්ථ ධ්‍යාන භූමීන් වේ.

★ අනාගාමී වූවන් උපදින සුද්ධාවාස භූමීන් පහකි.

1. අවිහය
2. අතප්පය
3. සුදස්සය
4. සුදස්සීය
5. අකනිට්ඨය යනු සුද්ධාවාස භූමීන් පහයි.

★ අරූප ධ්‍යාන උපදවා ගත් අය උපදින භූමි 4 කි.

1. ආකාසානඤ්චායතනය
2. විඤ්ඤාණඤ්චායතනය
3. ආකිඤ්චඤ්ඤායතනය
4. නේව. .ඤ්ඤානාසඤ්ඤායතනය යනු අරූපාවචර භූමි හතරයි.

★ ශුද්ධාවාස භූමීන්හි පෘතග්ජනයන් ද, සෝවාන් වූ අය ද සකෘදාගාමීන් ද නැත. (ශුද්ධාවාස භූමීන්හි අනාගාමී සහ රහත් උතුමන් සිටින බව මෙයින් කියවේ.)

★ අසංඥ භූමියෙහි ද අපාය භූමීන්හි ද ආර්යයෝ නොසිටිති.

★ ඉතිරි භූමින්හි ආර්යයෝ ද අනාර්යයෝ ද සිටිති.

සටහන: චතුර්ථ ධ්‍යාන උපදවා ඉන් අනතුරුව සංඥාව අත්හැරීමෙන් අසංඥ සමාධිය එළඹේ. අසංඥ සමාධිය යනු සමහර අබෞද්ධ යෝගීන් පිළිගන්නා විමුක්ති මාවතකි.

★ යක්ෂයන් අතර ද මාර්ගඵල ලාභීන් වූ බව සූත්‍ර ධර්මය අනුව පැහැදිලි වේ. සමහර යක්ෂයන් චාතුර්මහාරාජික දේව නිකායට අයත් බව ද තවත් සමහර යක්ෂයන් විනිපාත අසුර නිකායට අයත් බව ද සූත්‍ර ධර්ම අනුව වැටහෙයි. එබැවින් සත්ත්ව කොට්ඨාස කිහිපයක්ම පොදුවේ යක්ෂ යන නමින් හැඳින්වෙන බව අනුමාන කළ හැකිය.

★ අකුසල කර්මයන් නිසා අපායෙහි උපදියි.

★ දුර්වල කුශලයන්ගේ බලයෙන් ජාත්‍යන්ධ (උපතින් අන්ධ) ආදී අඩුපාඩු සහිත මිනිසුන් ද විනිපාත අසුරයෝ ද විමාන ප්‍රේතයෝ ද උපදිති.

★ මනුෂ්‍යයන්ගේ ද සතර අපායෙහි සත්ත්වයන්ගේ ද විනිපාත අසුරයන්ගේ ද ආයුෂ නියමයක් නැත. (මනුෂ්‍යයන්ගේ පරමායුෂ වසර 120 ක් පමණ වන්නේ මේ කාලයේදී ය. මනුෂ්‍යයන්ගේ ආයුෂ කලින් කල වෙනස් වේ.)

★ දෙවියන්ගේ ආයුෂ මෙසේය.

1. චාතුර්මහාරාජිකයේ ආයුෂය දිව්‍ය වර්ෂ පන්සීයකි. මනුෂ්‍ය ලෝකයේ කාලය අනුව එය අවුරුදු අනූ ලක්ෂයකි.
2. තව්තිසා දෙවියන්ගේ ආයුෂ එමෙන් හතර ගුණයකි.
3. යාම දෙවියන්ගේ ආයුෂ තව්තිසා දෙවියන්ගේ ආයුෂ මෙන් හතර ගුණයකි.
4. තුෂිත දෙවියන්ගේ ආයුෂ යාම දෙවියන්ගේ ආයුෂ මෙන් හතර ගුණයකි.
5. නිර්මාණරති දෙවියන්ගේ ආයුෂ තුෂිත දෙවියන්ගේ ආයුෂ මෙන් හතර ගුණයකි.



CamScanner

6. පරනිර්මිත වශවර්ති දෙවියන්ගේ ආයුෂ නිර්මාණරති දෙවියන්ගේ ආයුෂ මෙන් හතර ගුණයකි.

★ පරනිර්මිත වශවර්ති දෙවියන්ගේ ආයුෂ මනුෂ්‍ය ලෝකයේ වසරවලින් අවුරුදු නවසිය විසිකෝටි හැටලක්ෂයකි.

★ අසංඥ තලයේ උපන් සත්ත්වයාගේ රූපය පමණක් එහි හට ගනී. එම ලෝකයෙන් චුත වන විට රූපය චුත වී යයි.

★ ප්‍රථම ධ්‍යාන ලද්දවුන් උපදින බ්‍රහ්ම ලෝකයන්හි ආයුෂ මතු දැක්වේ.

1. බ්‍රහ්ම පාරිෂද්‍යයේ ආයුෂ ප්‍රමාණය අසංඛ්‍ය කල්පයකින් තුනෙන් පංගුවකි. (අසංඛ්‍ය කල්පය යනු ඉතා දිගු කාල සීමාවකි.)

2. බ්‍රහ්ම පුරෝහිතයේ ආයුෂ ප්‍රමාණය කල්ප භාගයකි.

3. මහා බ්‍රහ්මයන්ගේ ආයුෂ ප්‍රමාණය කල්පයකි

★ ද්විතීය ධ්‍යාන භූමීන්හි ආයුෂ මතු දැක්වේ.

1. පරිත්තාභයේ ආයුෂය කල්ප දෙකකි.

2. අප්‍රමාණභයේ ආයුෂය කල්ප හතරකි.

3. ආභස්සරයේ ආයුෂය කල්ප අටකි.

★ තෘතීය ධ්‍යාන භූමීන්හි ආයුෂ ප්‍රමාණය මතු දැක්වේ.

1. පරිත්තසුභයේ ආයුෂය කල්ප දහසයකි.

2. අප්‍රමාණසුභයේ ආයුෂය කල්ප තිස් දෙකකි.

3. සුභ කිණ්හයේ ආයුෂය කල්ප හැටහතරකි.

★ වේහප්ඵලයේ ද අසංඥ සත්ත්වයන්ගේ ද ආයුෂ කල්ප පන්සීයකි.

★ අනාගාමීන් උපදින සුද්ධාවාස ලෝකයන්හි ආයුෂ මතු දැක්වේ.

1. අවිහයේ ආයුෂය කල්ප දහසකි.



CamScanner

2. අතප්පයේ ආයුෂය කල්ප දෙදහසකි.

3. සුදස්සයේ ආයුෂය කල්ප හාරදහසකි.

4. සුදස්සියේ ආයුෂය කල්ප අටදහසකි.

5. අකණිෂ්ටයේ ආයුෂය කල්ප දහසයදහසකි.

★ අරූපාවචර ධ්‍යාන ලද්දවුන් උපදින භූමීන්හි ආයුෂ පහත දැක්වෙන පරිදි වේ.

1. ආකාසානඤ්චායතන භූමියෙහි ආයුෂ කල්ප විසිදහසකි.

2. විඤ්ඤාණඤ්චායතන භූමියෙහි ආයුෂ කල්ප හතළිස් දහසකි.

3. ආකිඤ්චඤ්ඤායතන භූමියෙහි ආයුෂ කල්ප හැටදහසකි.

4. නේවසඤ්ඤානාසඤ්ඤායතන භූමියෙහි ආයුෂය කල්ප අසූහාර දහසකි.

★ ප්‍රථම ධ්‍යානය යන්තමින් වැඩූ අය බ්‍රහ්ම පාරිෂද්‍ය භූමියෙහි උපදිති. ප්‍රථම ධ්‍යානය මධ්‍යම ලෙස වැඩූ අය බ්‍රහ්ම පුරෝහිත භූමියෙහි උපදිති. ප්‍රථම ධ්‍යානය හොඳින් හුරු කළ අය මහා බ්‍රහ්මයන් අතර උපදිති.

★ ද්විතීය ධ්‍යානය සුළු පමණින් වඩා පරිත්තාභ දෙවියන් අතර ඉපදීමට හැකිය. එය මධ්‍යම වශයෙන් වැඩීමෙන් අප්‍රමාණාභ දෙවියන් අතර ඉපදීමට හැකිය. එය හොඳින් හුරු කිරීමෙන් ආභස්සර දෙවියන් අතර ඉපදීමට හැකිය. තෘතිය ධ්‍යානය සුළු පමණින් වැඩීමෙන් පරිත්තසුභ දෙවියන් අතර ඉපදීමට හැකිය. තෘතීය ධ්‍යානය මධ්‍යම වශයෙන් වැඩීමෙන් අප්පමාණසුභ දෙවියන් අතර ඉපදීමට හැකිය. තෘතීය ධ්‍යානය හොඳින් හුරු කොට වැඩීමෙන් සුභකිණ්හ දෙවියන් අතර ඉපදීමට හැකිය.

★ චතුර්ථ ධ්‍යානය වැඩීමෙන් වේහප්ඵලයෙහි ඉපදීමට හැකිය.

චතුර්ථ ධ්‍යානයට සංඥා විරාග වශයෙන් වැඩීමෙන් අසංඥ තලයෙහි ඉපදීමට හැකිය.

සටහනඃ ධ්‍යාන ලාභීන්ගේ උත්පත්ති ස්ථානයන් පිළිබඳ මෙහි දක්වන ලද විස්තරය අභිධර්මාර්ථ සංග්‍රහය ලියූ අනුරුද්ධ නම් භික්ෂූන් වහන්සේගේ මතවාදයන් පිළිබිඹු කරයි. කෙසේ වෙතත් මෙම කෘතිය කියවන පාඨකයන්ගේ පහසුව තකා අනුරුද්ධ ආචාර්යවරයා පිළිගත් පංචම ධ්‍යාන ක්‍රමයට වෙනස්ව සූත්‍ර ධර්මයන්හි දැක්වෙන ධ්‍යාන විභාගයට අනුරූපව මෙම පරිච්ඡේදයෙහි ධ්‍යානයන් විස්තර කර ඇත.

## 28. කර්ම විභාගය

කර්ම වාදය බුදු දහමෙහි එන වැදගත් ඉගැන්වීමකි. බෞද්ධ කර්මවාදය ගැන ඉතා දීර්ඝ විස්තරයක් සූත්‍ර පිටකයෙහි ද අභිධර්ම පිටකයෙහි ද අඩංගු වේ. කර්මය පිළිබඳ අභිධර්ම ඉගැන්වීම්වල සාරාංශයක් අභිධර්මාර්ථ සංග්‍රහයෙහි අඩංගුය. මෙහි පහත දැක්වෙනුයේ කර්මය පිළිබඳ අභිධර්ම ඉගැන්වීම් කිහිපයකි.

★ කෘත්‍ය වශයෙන් සලකන කල කර්මය සතරාකාරය.

1. ජනක කර්මය (සත්ත්වයාට උත්පත්තිය ලබාදීමට ආධාරක වෙයි.)
2. උපස්ථම්භක කර්මය (උපත ලද සත්ත්වයාට ආධාරඋපකාර ලබාදීමට පිහිට වෙයි.)
3. උපපීඩක කර්මය (සත්ත්වයාට විවිධාකාර බාධා හිරිහැර ගෙන දෙයි.)
4. උපඝාතක කර්මය (සත්ත්වයාගේ ජනක කර්මයමැඩපවත්වා මරණය සිදුකරයි.)

★ විපාක දීමේ ක්‍රමය අනුව කර්ම හතරකි.

1. ගරුක කර්මය (මතු උපත සඳහා සෘජුවම බලපායි.)



CamScanner

2. ආසන්න කර්මය (ගරුක කර්ම නැති තැන මතු උපත ලබාදීමට බලපවත්වයි.)

3. ආචීර්ණක කර්මය (ගරුක හා ආසන්න කර්ම නොමැති විට මතු උපත ලබාදීමට බලපායි.)

4. කෘතත්වාත් කර්මය (ඉහත කර්ම එකක්වත් ඉදිරිපත් නොවුණ කල මතු උපතට බලපායි.)

★ විපාක දෙන කාල වශයෙන් කර්මය සතරාකාරය.

1. දෘෂ්ට ධර්ම වේද්‍ය කර්මය (මේ ආත්මභාවයේදීම විපාක දෙයි.)

2. උපපද්‍යවේද්‍ය කර්මය (ඊළඟ ආත්මභාවයේ විපාක දෙයි.)

3. අපරාපර්ය වේද්‍ය කර්මය (ඕනෑම ආත්මයක විපාක දෙයි.)

4. අහෝසි කර්මය (විපාක දිය හැකි කාලය ඉකුත් වූ කර්මය විපාක නොදෙයි.)

★ විපාක දෙන ස්ථාන වශයෙන් කර්ම සතරාකාරය.

1. අකුසලය

2. කාමාවචර කුසලය

3. රූපාවචර කුසලය

4. අරූපාවචර කුසලය

★ කර්මය ද්වාර (දොරටු) වශයෙන් තුන් ආකාරය.

1. කාය කර්ම

2. වචී කර්ම

3. මනෝ කර්ම එම කර්ම ආකාර තුන වේ.

★ සතුන් මැරීම, සොරකම සහ කාම මිථ්‍යාචාරය කාය කර්මයි.

★ බොරු කීම, කේලාම් කීම, පරුෂ වචන කීම හා හිස් බස් කීම වාග් කර්මයි.

★ අභිධ්‍යාව (මසුරුකම), ව්‍යාපාදය (තරහව) සහ මිථ්‍යා දෘෂ්ටිය (වැරදි දැක්ම) සිතෙහි හටගන්නා කර්ම හෙවත් මනඃ කර්ම නම් වේ.

★ සතුන් මැරීම, පරුෂ වචන, ව්‍යාපාදය (තරහව) යන කර්ම ද්වේෂ මූලයෙන් (ද්වේෂ මුල් කොට) උපදියි.

(මෙම ඉගැන්වීම තරමක ව්‍යාකූලභාවයක් පෙනේ. ද්වේෂයන් නොමැතිව ලෝභය මුල් කරගෙන ප්‍රාණඝාතය සිදුවිය හැකි බව පැහැදිලිය.)

★ කාම මිථ්‍යාචාරය, අභිධ්‍යාව (මසුරුකම), මිථ්‍යාදෘෂ්ටිය යන දේ ලෝභය මුල් කරගෙන උපදියි.

★ ඉතිරි පාපකර්ම ලෝභය නිසා ද, ද්වේෂය නිසා ද යන දෙයාකාරයෙන්ම සිදුවෙයි.

★ දානය, ශීලය හා භාවනාව කුසල කර්ම ගණයට වැටේ.

කාමාවචර කුසල කර්ම දහයකි.

1. දානය
2. ශීලය
3. භාවනාව
4. වෙයyාවච්ච (ආගමික වතාවත් කිරීම)
5. අපචායනය (පිදිය යුත්තන් පිදීම)
6. පත්තිදාන (පින්දීම)
7. පත්තානුමෝදනය (පින් අනුමෝදන්වීම)
8. ධර්ම ශ්‍රවණය
9. ධර්ම දේශනය
10. දෘෂ්ටිය ඍජු කර ගැනීම යන මේවා දස කුසල කර්ම නම් වේ.

★ රූපාවචර කුසල කර්ම සියල්ල මනඃ කර්ම හෙවත් සිතෙන් සිදුකරන කර්ම වේ.

# 29. මරණය සහ පුනර්භවය

මරණය යනු, කාටත් පොදු ඉරණමකි. සත්ත්වයාගේ මරණය සිදුවන ආකාරය පිළිබඳව අභිධර්මයෙහි විස්තර කර ඇත්තේ සුවිශේෂී ආකාරයකටය. මරණය පිළිබඳව බෞද්ධ පොත්පත්වල දැක්වෙන කරුණු වැඩි ප්‍රමාණයකටම පදනම් වී ඇත්තේ අභිධර්ම ඉගැන්වීම්ය. ඉපැරණි අභිධර්ම ග්‍රන්ථයක් වූ අභිධර්මාර්ථ සංග්‍රහයෙහි මරණය පිළිබඳව විස්තර දැක්වෙනුයේ මෙසේය.

★ සත්ත්වයාගේ මරණය සිදුවිය හැකි ආකාර (හේතු) හතරකි.

1. ආයුෂ අවසන් වීමෙන්
2. ජනක කර්ම ශක්ති අවසන් වීමෙන්
3. ඒ දෙකම එකවර අවසන් වීමෙන්
4. හදිසියේ බලපාන වෙනත් (උපච්ඡේදක) කර්මයක බලපෑමෙන් මරණය සිදුවිය හැකිය.

★ මරණාසන්න මොහොතේදී මතු උපතට බලපාන ජනක කර්මය ආශ්‍රිතව 'නිමිත්තක්' ඇසට, කනට, නාසයට, දිවට හෝ කයට වැටහේ.

★ එවැනි මරණාසන්න 'නිමිති' වල ආකාර තුනකි.

1. කර්මය - තමා කළ කර්මය මතක් වේ.
2. කර්ම නිමිත්ත - කර්මය කළ ආකාරය මතක් වේ.
3. ගති නිමිත්ත - මතු නැතහොත් භවයෙහි උත්පත්තියේ ස්වභාවය මතක් වේ.

★ මෙලෙස මරණාසන්න 'නිමිත්ත' සිතට වැටහුණු පසු හිත ඒ දෙසට නැමී යයි. ඉන් අනතුරුව සත්ත්වයා භවයෙන් චුත වේ. අනතුරුව වහාම ඊළඟ භවයේ ප්‍රතිසන්ධි සිත පහළ වේ. (මරණයත් සමගම ඊළඟ භවයට යාම සිදුවන බව ථේරවාදී ඉගැන්වීමකි. මෙම ඉගැන්වීම අන්තරාභවය යන පසුකාලීන

ඉගැන්වීමට පටහැණි නොවේ. මන්ද යත් අන්තරාභවය ද එක්තරා භවයක් ලෙස සැලකිය හැකි බැවිනි.)

## 30. අභිධර්මය පිළිබඳ ආචාර්ය මතවාද

මූලික සූත්‍ර දේශනා යන අභිධර්ම පිටකයේ ඉගැන්වෙන කරුණු අතර ඇති සමවිෂමතා අධ්‍යයනය කිරීම සහ ඒ පිළිබඳව මතවාද පළ කිරීම දැනට සියවස් විස්සකට අධික කාලයකට පෙර පටන් පැවතුණු බව ශාසන ඉතිහාසය අධ්‍යයනය කරන විට පෙනී යන කරුණකි.

සූත්‍ර දේශනා සහ අභිධර්මයෙහි සඳහන් කරුණු අතර එකිනෙකට වෙනස්ව කළ අර්ථ දැක්වීම් කිහිපයක්ම පහසුවෙන් සපයා ගත හැකිය. මේ ඒ සඳහා නිදසුන් කිහිපයකි.

1. සූත්‍ර දේශනාවන්හි ඉගැන්වෙන පරිදි රූපාවචර ධ්‍යාන සතරකි. අභිධර්ම ක්‍රමය අනුව රූපාවචර ධ්‍යාන පහකි.

මේ ඉගැන්වීම් දෙක එකිනෙකට පටහැණි නොවේ. අභිධර්ම ක්‍රමයේ දී ප්‍රථම ධ්‍යානය සහ ද්විතීය ධ්‍යාන අතර පවතින පරිවර්තනීය අවස්ථාවක් වන අවිතර්ක, සවිචාර සමාධිය ද වෙනස් ධ්‍යානමය අවස්ථාවක් ලෙස සලකා ඇති බැවිනි. කෙසේ නමුත් අභිධර්ම ක්‍රමයේදී පංචම ධ්‍යානය ලෙස සලකා ඇත්තේ සූත්‍ර පිටක ක්‍රමය අනුව පිළිගනු ලබන චතුර්ථ ධ්‍යානයයි.

2. සූත්‍ර පිටක ක්‍රමය අනුව සංස්කාරයන්ගේ උත්පාද - වය (විනාශ) අවස්ථා දෙක සලකා සුවිශේෂ ඥාන ඉපදවීම කරනු ලැබේ.

අභිධර්මය අනුව පරමාර්ථ කර්මයන්ගේ උත්පාද, ස්ථිති (පැවැත්ම), භංග යන අවස්ථා තුනම සලකනු ලැබේ.

3. ථේරවාද ගුරුකුලය විසින් පිළිගනු ලබන අභිධර්ම ඉගැන්වීම් අනුව චිත්ත, චෛතසික, රූප යන පරමාර්ථ ධර්ම තුනම වේගයෙන් බිඳී බිඳී නැවත ඇතිවන ස්වභාවය ඇති දේ බව

සලකනු ලැබේ. කෙසේ නමුත් සූත්‍ර පිටක ක්‍රමයේදී සත්ත්වයන්ගේ උත්පාද හෙවත් උපත ද විපරිණාමය ද මරණය ද සලකා බලනු ලබන්නේ සාමාන්‍ය සම්මුතිය මත පිහිටන විටය. සිත වහ වහා වෙනස් වන බවත්, කය ඊට වඩා සෙමින් වෙනස් වන බවත් සූත්‍ර පිටකයේ දක්වා ඇත.

4. ථේරවාදීන්ගේ අභිධර්ම ග්‍රන්ථවල ඇති චිත්ත වීථි ක්‍රමය අනෙකුත් ගුරුකුලවලට අයත් ආචාර්යවරුන් පිළිගන්නේ නැත.

5. ථේරවාදීන්ගේ ධර්ම ග්‍රන්ථවල එන රූප කලාප පිළිබඳ අදහස් බෞද්ධ පරමාණුවාදය දක්වා දුර දිග ගියේය.

## 31. බෞද්ධ පරමාණුවාදය

පදාර්ථය හෙවත් ඝන, ද්‍රව හා වායු යන දේ පරමාණුවලින් හා අණුවලින් තැනී ඇති බව නූතන විද්‍යාව විසින් එකහෙළා පිළිගන්නා සත්‍යයකි. නූතන භෞතික විද්‍යාවට හා රසායන විද්‍යාවට පරමාණු පිළිබඳ සංකල්පය තරමක් අලුත් දෙයක් වුව ද ඇනට වසර දහස් ගණනකට පෙර සිටි බෞද්ධ භික්ෂූහු පරමාණු හා අණු පිළිබඳ සංකල්ප ඉතා විශිෂ්ට ලෙස දැක්වීමට සමත් වූහ.

බෞද්ධ පරමාණුවාදය බිහිකරන ලද්දේ ථේරවාදී ගුරුකුලයටම අයත් භික්ෂු පිරිසක් වන සාර්වස්තිවාදීන් විසිනි. සාර්වස්තිවාදීහු අතීත, වර්තමාන, අනාගත යන කාලත්‍රයටම යථාර්ථ ලෙස පවතින ඒවා බව කීහ. එමෙන්ම පදාර්ථය හෙවත් ඝන, ද්‍රව හා වායු යන දේ ද යථාර්ථ ලෙස (සැබෑ) පවතින බව සාර්වස්තිවාදීහු විශ්වාස කළහ. සාර්වස්තිවාදීන්ගේ පරමාණුක-වාදය ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් අතර විශිෂ්ටතම එකකි. එම ඉගැන්වීම්වල සාරාංශය මතු දැක්වේ.

1. පදාර්ථය තැනී ඇත්තේ පරමාණුවලිනි.
2. පදාර්ථයේ කුඩාතම ඒකකය ද්‍රව්‍ය පරමාණුවයි.

3. පරමාණු එකිනෙක බැඳී (අණු හෙවත්) සංඝාත පරමාණු සෑදේ.

4. විවිධ වස්තු සෑදී ඇත්තේ සංඝාත පරමාණුවලිනි.

5. පරමාණු එකිනෙක ඉතා ළංව ඇතත් ඒවා එකිනෙක නොගැටේ. පරමාණු අතර කුඩා අවකාශ ඇත.

බෞද්ධ පරමාණුවාදය පිළිබඳව සමහර අදහස් ක්‍රම ක්‍රමයෙන් ලක්දිව ථේරවාදි ගුරුකුලය තුළ ද පිළිගැනීමට ලක්විය.

# 32. වේදල්ල ධර්ම කාණ්ඩය

ශ්‍රී සද්ධර්මයෙහි කොටස් 9 ක් ඇති බව බුද්ධ කාලයේ සිටම පිළිගනු ලැබීය. ඒ කොටස් 9 'නවාංග ශාස්තෘ ශාසනය' නම් වේ. වෙනත් අයුරකින් දක්වතොත්, ශාස්තෘ ශාසනය අංග නවයකට බෙදා පෙන්විය හැකිය. නවාංග ශාස්තෘ ශාසනයේ ගැඹුරු හා දුරවබෝධ ධර්ම කොට්ඨාස දෙක අභිධර්ම හා වේදල්ල යනුවෙන් වෙන් කර දක්වා ඇත. චිත්ත, චෛතසික, රූප හා නිර්වාණ යන සතර පරමාර්ථ ධර්ම ගැන ගැඹුරු විග්‍රහයක් අභිධර්මයෙහි අඩංගු වේ. ශාස්තෘ ශාසන ඵලය විස්තර කරනුයේ වේදල්ල ධර්ම කොට්ඨාසයෙනි. ධ්‍යාන, සමාපත්ති, මාර්ගඵල යනාදී උසස් ප්‍රතිඵල ගැන විස්තරාත්මක කරුණු වේදල්ල ධර්මයෙහි අඩංගු වේ.

වේදල්ල ධර්මය ගැන කරුණු දක්වන බුදුහු අභිධර්ම, වේදල්ල යන ධර්ම කරුණු මාර්ගඵල ලාභීන් පමණක් අනුන්ට විස්තර කර දිය යුතු බව දේශනා කරති. මාර්ගඵල ලාභීන් නොවන අය එම දහම් කොටස් විස්තර කරන්නට යාමේදී වැරදි අර්ථකථන දීමෙන් එම ධර්ම කොට්ඨාස අවුල් වී යාමට ඇති ඉඩ බුදුහු බැහැර නොකරති. ශාස්තෘ ශාසනයේ පරිහානිය හෙවත් අන්තර්ධානය ගැන කරුණු දක්වන බුදුහු ශාස්තෘ ශාසනයෙන් පළමුව ගිලිහී යන්නේ අභිධර්ම, වේදල්ල යන දුරවබෝධ ධර්ම කාණ්ඩයන් බව ප්‍රකාශ කරති.

නියම වේදල්ල ධර්මය කුමක් ද යන්න පිළිබඳව සම්බුද්ධ පරිනිර්වාණයෙන් සියවස් කිහිපයක් ගත වෙත්ම ප්‍රශ්න මතු විය. මන්දයත් වේදල්ල ධර්ම යනුවෙන් ධර්ම කොට්ඨාසයක් සංගීතිකාරක භික්ෂූන් වහන්සේලා විසින් සංග්‍රහ නොකළ බැවිනි. මහායානිකයෝ වේදල්ලය වෛපුල්‍යතාව හෙවත් දක්ෂතාවට සම කළහ. මහායානිකයෝ බෝධිසත්ත්ව චර්යාව වේදල්ලය බව කියා සිටියහ. බෝධිසත්ත්ව චර්යාව පිළිබඳ දීර්ඝ විස්තර අඩංගු මහායාන ග්‍රන්ථ වෛතුල්‍ය ප්‍රකරණ යන නමින් ද හඳුන්වනු ලැබීය.

නියම වේදල්ල ධර්මය කුමක් ද යන්න පිළිබඳව අද කාලයේ පවා තර්ක විතර්ක මතුව එයි. සමහර භික්ෂූන් වහන්සේලා පිළිගනුයේ ධර්ම සාකච්ඡාවන් වේදල්ල ධර්මය වන බවයි. නියම වේදල්ල ධර්මය කුමක් ද යන්න පිළිබඳව තීරණාත්මක පිළිතුරක් සොයා ගැනීමට සූත්‍ර පිටකයේ වේදල්ල සූත්‍ර වෙත යොමු විය හැකිය.

1. මහා වේදල්ල සූත්‍රය
2. චුල්ල වේදල්ල සූත්‍රය
3. ආළාර වේදල්ලය

යනුවෙන් සූත්‍ර පිටකයට අයත් වේදල්ල සූත්‍ර තුනකි. මෙයින් මුල් සූත්‍ර දෙක මජ්ඣිම නිකායට අයත්ය. එම සූත්‍ර දෙකෙහි ප්‍රශ්න, උත්තර ස්වභාවයෙන් ගැඹුරු ධර්ම කරුණු සාකච්ඡා කර ඇත. තුන්වන සූත්‍රය වන ආළාර වේදල්ලය සංගීතිකාරක භික්ෂූන් වහන්සේලා විසින් මහා පරිනිර්වාණ සූත්‍රයට එක් කර ඇත්තේ බුදුන් වහන්සේගේ අවසන් දේශනා තුළට එය ද අයත් බැවිනි.

වේදල්ල ධර්ම කරුණු ගවේෂණය කරනු කැමති පිරිසට සහය වනු පිණිස වේදල්ල සූත්‍රවල සාරාංශයක් මෙතැන් සිට දැක්වේ.

# 33. මහා වේදල්ල සූත්‍රය

මහා කොට්ඨිත තෙරුන් වහන්සේ සැරියුත් තෙරුන් වහන්සේගෙන් විමසූ ධර්ම කරුණු කිහිපයක් මෙහි දැක්වේ.

★ දුෂ්ප්‍රාඥයා යනු කවරෙක් ද?

නොදන්නා පුද්ගලයා දුෂ්ප්‍රාඥයෙකි.

★ කුමක් නොදැනීමෙන් දුෂ්ප්‍රාඥයෙකු වේ ද?

චතුරාර්ය සත්‍යය නොදැනීමෙන් දුෂ්ප්‍රාඥයෙකු වේ.

★ ප්‍රාඥයා යනු කවරෙක් ද?

චතුරාර්ය සත්‍යය දත් තැනැත්තා ප්‍රාඥයෙකි.

★ විඤ්ඤාණය යනු මිශ්‍ර වූ දෙයක් ද? අමිශ්‍ර දෙයක් ද? විඤ්ඤාණය මිශ්‍ර වූ දෙයකි. එය ප්‍රඥාව සමග මිශ්‍ර වූ දෙයකි. යමක් ප්‍රඥාවෙන් වටහා ගන්නේ නම් එය විඤ්ඤාණයට වැටහේ. යමක් විඤ්ඤාණය විසින් වටහා ගත්තේ නම් එය ප්‍රඥාවෙන් අවබෝධ වේ. එබැවින් 'ප්‍රඥාව' විඤ්ඤාණයෙන් වෙන් කොට විස්තර කළ නොහැකිය.

★ එසේ නම් ප්‍රඥාව සහ විඤ්ඤාණය අතර වෙනස කුමක් ද?

ප්‍රඥාව වැඩිය යුතු දෙයකි. විඤ්ඤාණයෙන් දැනගැනීම සිදුවේ.

★ වේදනාව යනු කුමක් ද?

විඳීම හෙවත් වින්දනය 'වේදනා' නම් වේ.

★ 'විඳීම වේදනාවයි' යන්නෙහි අර්ථය කුමක් ද?

සැප, දුක් හෝ උපේක්ෂා සහගත වේදනාවන් වින්දනය කිරීම මෙයින් අදහස් වේ.

★ 'සංඥාව' යනු කුමක් ද?

සංඥා යනු හඳුනා ගැනීමයි.



CS CamScanner

★ හඳුනා ගැනීම යනු කුමක් ද?

මෙයට නිල්, කහ, රතු, සුදු ආදී වර්ණ හඳුනා ගැනීම උදාහරණයක් ලෙස සැපයිය හැකිය.

★ වේදනා, සංඥා, විඤ්ඤාණ යන දේ මිශ්‍ර ද? අමිශ්‍ර ද?

මේවා මිශ්‍ර ධර්මතාවන්ය.

වේදනාව ඇති තැන එම වේදනාව හඳුනා ගනියි. වේදනාව හඳුනා ගත් තැන විඤ්ඤාණය ඒ බව දනී. (මේ අයුරින් වේදනා, සංඥා, විඤ්ඤාණ යන ධර්මතා තුන මිශ්‍ර වේ.)

පංචේන්ද්‍රියන්ගේ උපකාර නොමැති මනෝවිඤ්ඤාණයෙන් කුමක් ග්‍රහණය කරගත හැකි ද?

1. ආකාසය අනන්තය යන හැඟීම ඇතිව ආකාසානංචායතනය (සංඥාව) ඉපිදවිය හැකිය.
2. විඤ්ඤාණය අනන්තය යන හැඟීම ඇතිව විඤ්ඤාණඤ්චායතනය (සංඥාව) ඉපිදවිය හැකිය.
3. කිසිවක් නැත යන හැඟීම ආකිඤ්චඤ්ඤායතනය (සංඥාව) ඉපිදවිය හැකිය.

(අරූපාවචර ධ්‍යාන ලැබීමේ ක්‍රමයක් මෙහි විස්තර වේ. එනම් පසිඳුරන්ගෙන් එන සංඥාවන් අත්හැර ඉහත කී ක්‍රමයට අභ්‍යාස කිරීමෙන් පෙර කී එක් එක් ධ්‍යාන සිත් ඉපිදවිය හැකිය.)

★ අවබෝධ කරගත යුතු සත්‍යය කෙසේ අවබෝධ කරගත යුතුද?

එය ප්‍රඥා ව්‍යුහයෙන් අවබෝධ කරගත යුතුය. (නුවණින් අවබෝධ කළ යුතුය.)

★ ප්‍රඥාවේ ප්‍රයෝජනය කුමක් ද?

නුවණින් දත යුතු දේ අවබෝධ කිරීමටත්, පහ කළ යුතු දේ පහ කිරීමටත් ප්‍රඥාව උපකාරී වේ.



CamScanner

★ සම්‍යක් දෘෂ්ටිය ඉපදවීමට හේතු කීයක් ඇද් ද?

හේතු දෙකකි.

1. ධර්ම ශ්‍රවණය

2. නුවණ මෙහෙයවා එය විමසීම

එම හේතු දෙකයි. තවද සම්‍යක් දෘෂ්ටිය කරුණු පහකින් පෝෂණය කළ යුතුය. එවිට,

1. ප්‍රඥා විමුක්තිය (ධර්මාවබෝධය)

2. චේතො විමුක්තිය (චිත්ත සමාධිය) ලැබේ.

සම්‍යක් දෘෂ්ටිය පෝෂණය කළ යුතු ආකාර පහ මෙසේය.

1. ශීලයෙන්

2. ඇසූ පිරූ තැන් ඇති බවින්

3. ධර්ම සාකච්ඡාවෙන්

4. සමථ භාවනාවෙන්

5. විදර්ශනා භාවනාවෙන්

යන ආකාර පහෙන්ම සම්‍යක් දෘෂ්ටිය පෝෂණය කළ කල්හි පෙර කී ප්‍රඥා විමුක්තිය ද චේතො විමුක්තිය ද ලැබේ.

(මෙහි ප්‍රඥා විමුක්තිය යනු අර්හත් ඵලයයි. චේතො විමුක්තිය යනු ධ්‍යාන ඉපිදවීමයි.)

★ භව (උප්පත්ති ස්ථාන) කීයක් ඇද් ද?

භව තුනක් ඇත.

1. කාම භව (කාමාවචර සුගති සහ දුගති)

2. රූප භව (රූපාවචර බ්‍රහ්ම ලෝක)

3. අරූප භව (අරූපාවචර බ්‍රහ්ම ලෝක)

එම භව තුනයි.



CamScanner

★ සත්ත්වයා මතු භවයෙහි උපත ලබනුයේ ඇයි?

1. අවිද්‍යාව (චතුරාර්ය සත්‍යය නොදැනීම)
2. තෘෂ්ණාව යන හේතු නිසා භවයෙහි උපත ලබයි.

★ මතු උපත නොලබනුයේ කුමන හේතු මත ද?

1. අවිද්‍යාව
2. තෘෂ්ණාව

පහ කිරීමෙන් මතු උපත නැතිවේ.

★ ප්‍රථම ධ්‍යානයෙහි අංග කීයක් වෙද් ද?

ප්‍රථම ධ්‍යානයෙහි අංග පහකි.

1. විතර්ක (අරමුණු හිතට නැංවීම)
2. විචාර (අරමුණු හිතෙන් විමසීම)
3. ප්‍රීති (සිතෙහි හටගත් ධ්‍යානමය ප්‍රීතිය)
4. සුඛ (කායික සුවය)
5. ඒකාග්‍රතා (එක අරමුණක සිත රැඳවීම)

යනු ප්‍රථම ධ්‍යානයේ අංග පහයි.

★ ප්‍රථම ධ්‍යානයෙහි අංග කීයක් ප්‍රහීණ ද?

ප්‍රථම ධ්‍යානයේ අංග පහක් ප්‍රහීණය

1. කාමච්ඡන්ද (කම් සැපෙහි කැමැත්ත)
2. ව්‍යාපාද (තරහව)
3. ථීන මිද්ධ (අලස බව සහ මත් බව)
4. උද්දච්ච කුක්කුච්ච (සිතෙහි සැලෙන බව සහ කුකුස)
5. විචිකිච්ඡා (සැකය)

යන අංග පහ ප්‍රථම ධ්‍යානයෙහි නැත.

★ ඇස, කන, නාසය ආදී ඉන්ද්‍රිය උනුන්ට ගෝචර නොවන්නේය



CamScanner

යන්නෙහි තේරුම කුමක් ද?

ඇස දකින දේ කනට නොඇසෙයි. (මේ ආදී ලෙස සංවේදන වෙනත් ඉන්ද්‍රිය මගින් හඳුනා ගත නොහැකිය.) මෙලෙස එක ඉන්ද්‍රියයකට විෂය වන දේ එකක් අනෙකකට විෂය නොවේ.

★ පංචේන්ද්‍රිය කුමක් නිසා (නොනැසී) පවතී ද?

ආයුෂ නිසා ඒවා පවතී.

★ ආයුෂ කුමක් නිසා පවතී ද?

උණුසුම නිසා ආයුෂ පවතී. එමෙන්ම ආයුෂය නිසා උණුසුම පවතී. පහන් සිළක එළියත් එහි දැල්ලත් මෙනි. පහනේ දැල්ල පෙනෙන්නේ එළිය නිසාය. එනමුත් එළිය ඇති වනුයේ පහන් දැල්ල නිසාය.

★ ආයුෂයත්, සංස්කාරත් (සෙලවීම ආදිය) එම පුද්ගලයා ද? වෙනත් දෙයක් ද?

ආයුෂ හා සංස්කාර එම පුද්ගලයාම නොවේ. මන්දයත් එසේ වී නම් (ආයුෂ හා සංස්කාර එම පුද්ගලයාම වී නම්) කිසිවෙකුට නිරෝධ සම්පත්තියෙන් නැගී සිටීමට නොහැකි වනු ඇත.

★ කුමක් නිසා මළ සිරුරක් දරකඩක් මෙන් නිසල වේද?

1. ආයුෂය
2. උෂ්ණය
3. විඤ්ඤාණය

යන තුන නැති නිසා මළ සිරුර නිසලව පවතියි.

★ මළ සිරුරකත් නිරෝධ සමාපත්තියට සමවැදුණු අයෙකු-ගේත් වෙනස කුමක් ද?

මිය ගිය තැනැත්තාගේ-

1. ආශ්වාස ප්‍රශ්වාස නැත.

2. විතර්ක, විචාර නැත. (අරමුණු ගැනීම් හා අරමුණු විමසීම නැත.)

3. සංඥා, වේදනා නැත.

4. ආයුෂ ක්ෂය වී ඇත.

5. සිරුරේ උෂ්ණය නැත.

6. ඉන්ද්‍රිය නැසෙයි.

නිරෝධ සමාපත්තියට සමවැදුණු අයෙකුගේ-

1. කාය සංස්කාර (කයෙහි සෙලවීම) නැත.
2. ආශ්වාස ප්‍රශ්වාස නොමැත.
3. විතර්ක, විචාර නිරුද්ධය.
4. සංඥා, වේදනා නිරුද්ධය.
5. ආයුෂ ඉතිරිය.
6. සිරුරේ උෂ්ණය රැකෙයි.
7. ඉන්ද්‍රිය නොදිරයි.

මේ අවස්ථා දෙක අතර වෙනස එපරිදිය.

★ උපේක්ෂා සමවතට සමවදිනුයේ කෙසේ ද?

හේතු 4 ක් ඊට මූලික වේ.

1. සැපය අත්හැරීම.
2. දුක අත්හැරීම.
3. සොම්නස (සතුට) අත්හැරීම.
4. දොම්නස අත්හැරීම.

මෙලෙස සිහිය පවත්වා ගැනීමෙන් උපේක්ෂා සමාපත්තියට එළඹිය හැකිය.

(උපේක්ෂා භාවනාව වැඩීමෙන් චතුර්ථ ධ්‍යානයට පැමිණීමට හැකිය. උපේක්ෂා භාවනාව වැඩීමේ ක්‍රම විස්තර වන

තැන් සූත්‍ර පිටකයෙහි අන් තැන්හි විරලය. ධ්‍යානාංග සිඳහෙළීම හෙවත් අනුපූර්ව නිරෝධ ක්‍රමය හැර වෙනත් ක්‍රමවලට චතුර්ථ ධ්‍යානයට සමවැදීමට හැකි බවට කදිම නිදසුනකි.)

★ අනිමිත්ත සමාධියට (අනිමිත්ත චේතො විමුක්තියට) සමවදිනුයේ කෙසේ ද?

1. සියලු නිමිති නොමෙනෙහි කිරීම.
2. නිවන මෙනෙහි කිරීම.

යන අභ්‍යාසයෙන් අනිමිත්ත සමාධිය මතුවෙයි.

★ අනිමිත්ත චේතො විමුක්තියේ පැවැත්මට කරුණු කීයක් බලපායි ද?

අනිමිත්ත චේතො විමුක්තියේ පැවැත්මට කරුණු තුනක් ආධාරක වේ.

1. කල් නියම කර ගැනීම. (සමවතෙහි මේ තරම් කල් සිටිමි යනුවෙන් මුලදීම සිතාගැනීම.)
2. සියලු නිමිති මෙනෙහි නොකිරීම.
3. නිවන (අනිමිත්ත ධාතුව) මෙනෙහි කිරීම.

★ අනිමිත්ත චේතො විමුක්තියෙන් නැගී සිටිනුයේ කෙසේ ද?

1. සියලු නිමිති නොමෙනෙහි කිරීම.
2. අනිමිත්ත ධාතුව ද (නිවන ද) නොමෙනෙහි කිරීම.

යන කරුණු මත අනිමිත්ත චේතො විමුක්තියෙන් නැගී සිටිය හැකිය.

★ අප්‍රමාණ සමාධිය, ආකිඤ්චඤ්ඤ සමාධිය, අනිමිත්ත සමාධිය, සුඤ්ඤත සමාධිය යන ධර්ම එකම අර්ථ ඇති දේ ද? බහු අර්ථ ඇති දේ ද?

ඒවා එකම අර්ථ ඇති ලෙස ද බහු අර්ථ ඇති ලෙස ද තේරුම් කර දිය හැකිය.

★ එකී සමාධීන් හතර බහු අර්ථ වනුයේ කෙසේ ද?

1. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන භාවනාවන් අප්‍රමාණ කොට (අප්‍රමාණ ඉඩකට) පතුරුවා හළ හැකිය. මෙය අප්‍රමාණ චේතො විමුක්තියයි.
2. විඤ්ඤාණංචායතනය පසුකර ආකිංචඤ්ඤායතනය වෙත සමවැදීම ආකිංච චේතො විමුක්තියයි.
3. කැලයකට, රුක් මුලකට හෝ නිදහස් තැනකට ගොස් සියලු දෙය ආත්ම ගුණයෙන් ශූන්‍ය යනුවෙන් මෙනෙහි කිරීමෙන් ශූන්‍යතා චේතො විමුක්තියට පැමිණීමට හැකිය.
4. සියලු නිමිති මෙනෙහි කිරීමෙන් අනිමිත්ත සමාධියට පැමිණීමට හැකිය.

★ පෙර කී සමාධීන් හතර එකම අර්ථයට පැමිණෙන්නේ කෙසේ ද?

අර්හත් ඵල සමාධියට පැමිණීමෙන් එම සමාධීන් හතරෙහිම ගුණ එකම අර්ථය තුළට පැමිණේ. අර්හත්ඵල සමාධියට 'අකෝප්‍ය චේතො විමුක්තිය' යැයි ද කියනු ලැබේ. සියලු ආකාර ආකිංච සමාධිවලින් අකෝප්‍ය චේතො විමුක්තිය අග්‍ර වේ. මන්දයත් එහි රාගය, ද්වේෂය හා මෝහය ප්‍රහීණ බැවිනි.



CamScanner

# 34. චූල වේදල්ල සූත්‍රය

විශාක උපාසකයා පෙර තම භාර්යාව වූ ධම්මදින්නා භික්ෂුණිය සමග ධර්ම සාකච්ඡාවක යෙදෙයි. විශාක අසන ලද ගැඹුරු ධර්ම ගැටලුවලට ධම්මදින්නා තෙරණියෝ ඉතා ප්‍රඥාවන්ත ලෙස පිළිතුරු ලබා දුන්හ. පසුව විශාක උපාසක තෙම බුදුන් හමුවෙහි මෙම සාකච්ඡාවෙහි කරුණු හෙළිදරව් කළ විට බුදුහු ධම්මදින්න තෙරණියගේ අර්ථදැක්වීම් සියල්ල අනුමත කළහ.

★ සක්කාය යනු කුමක් ද?

1. රූපයෙහි ඇල්ම (රූප උපාදානස්කන්ධ නම් වේ. මෙහි රූප යන්නට රූප, ශබ්ද, ගන්ධ, රස හා ස්පර්ශ යන පහම ඇතුළත්ය.)
2. වේදනාවෙහි ඇල්ම (උපාදානය)
3. සංඥාවෙහි ඇල්ම
4. සංස්කාරයෙහි ඇල්ම
5. විඤ්ඤාණයෙහි ඇල්ම

යන කරුණු පහ සක්කාය නම් වේ.

★ සක්කාය ඇති වනුයේ කෙසේ ද?

තෘෂ්ණාව නිසා 'සක්කාය' ඇති වේ.

1. කාම තණ්හා (කම්සැප කැමැත්ත)
2. භව තණ්හා (නැවත ඉපදෙනු කැමැත්ත)
3. විභව තණ්හා (මතු උපතක් නැති නිසා මේ භවයේදී සැප විඳීමේ කැමැත්ත)

ආදී ලෙස තෘෂ්ණාව විවිධාකාරය.

★ සක්කාය නිරුද්ධ වනුයේ කෙසේ ද?

තෘෂ්ණාව නිරුද්ධ වීමෙන්ම සක්කාය නිරෝධය වේ.



CamScanner

★ සක්කාය නිරෝධගාමිණී පටිපදාව යනු කුමක් ද?

1. සම්මා දිට්ඨි
2. සම්මා සංකප්ප
3. සම්මා වාචා
4. සම්මා කම්මන්ත
5. සම්මා ආජීව
6. සම්මා වායාම
7. සම්මා සති
8. සම්මා සමාධි

යන ආර්ය අෂ්ටාංගික මාර්ගය සක්කාය නිරෝධගාමිණී පටිපදාවයි.

★ පංචස්කන්ධය සහ පංච උපානස්කන්ධය දෙකක් ද එකක් ද?

දෙකක් නොවේ. එකම ද නොවේ. පංචස්කන්ධය කෙරෙහි ඇති කැමැත්ත හා ඇල්ම පංච උපාදානස්කන්ධයයි.

★ සක්කාය දිට්ඨි යනු කුමක් ද?

අසෘතවත් පෘතග්ජනයා රූප, වේදනා, සංඥා, සංඛාර, විඥ්ඥාණ යන දේ ආත්මය වශයෙන් ද (ආත්මයෙහි එය ඇති බවද එහි ආත්මය ඇති බව ද) ගනියි. මෙය සක්කාය දිට්ඨිය ඇතිවීමයි.

★ සක්කාය දිට්ඨිය පනවනුයේ කෙසේ ද?

පංචස්කන්ධය ආත්මය ලෙස නොගැනීමෙන්ම සක්කාය දිට්ඨිය පහවෙයි. එනම්,

1. රූපය ආත්මය ලෙස නොගනියි.
2. වේදනාව ආත්මය ලෙස නොගනියි.
3. සංඥාව ආත්මය ලෙස නොගනියි.

4. සංස්කාර ආත්මය ලෙස නොගනියි.

5. විඤ්ඤාණය ආත්මය ලෙස නොගනියි.

★ ආර්ය අෂ්ටාංගික මාර්ගය යනු කුමක් ද?

1. සම්මා දිට්ඨි

2. සම්මා සංකප්ප

3. සම්මා වාචා

4. සම්මා කම්මන්ත

5. සම්මා ආජීව

6. සම්මා වායාම

7. සම්මා සති

8. සම්මා සමාධි යනු ආර්ය අෂ්ටාංගික මාර්ගයයි.

★ ආර්ය අෂ්ටාංගික මාර්ගය සංඛත ද? (හේතුඵල ධර්ම මත පිහිටයි ද?) අසංඛත ද? (හේතුඵල ධර්මවලින් බැහැරව පිහිටයි ද?)

ආර්ය අෂ්ටාංගික මාර්ගය හේතුඵල අනුව පවතින්නකි. (සංඛතය)

★ සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිවිධ ස්කන්ධයෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගය සමන්විත ද? නැතහොත් ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් ත්‍රිවිධ ස්කන්ධය සමන්විත ද?

ස්කන්ධ තුනෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගය සමන්විත වේය යන්න දතයුතුය. ඒ මෙසේය.

1. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන තුන සීලයට අයත්ය.

2. සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන්න සමාධියට අයත්ය.

3. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප යන්න ප්‍රඥාවට අයත්ය.

★ සමාධිය යනු කුමක් ද?

සිතෙහි ඒකාග්‍රතාව සමාධියයි.

★ සමාධි නිමිති මොනවා ද?

සතර සතිපට්ඨානය සමාධියට නිමිති වේ.

★ සමාධියට පරිෂ්කාර (පිරිකර) මොනවා ද?

සතර සම්‍යක් ප්‍රධානය සමාධියට පිරිකර වේ. (නූපන් කුසල් ඉපිදවීම, උපන් කුසල් වැඩිදියුණු කිරීම, නූපන් අකුසල් නූපදවා සිටීම, උපන් අකුසල් බැහැර කිරීම යන දේ සතර සම්‍යක් ප්‍රධාන වේ.)

★ සමාධි භාවනා යනු කුමක් ද?

පෙර කී ධර්මයන්ම සේවනය කිරීම, පුහුණු කිරීම, බහුල කිරීම සමාධි භාවනා නම් වේ.

★ සංස්කාර (සකස් වීම්) මොනවා ද?

සංස්කාරවල ආකාර තුනකි.

1. කාය සංස්කාර
2. වාක් සංස්කාර
3. චිත්ත සංස්කාර

★ කාය සංස්කාර යනු මොනවා ද?

ආශ්වාසය හා ප්‍රශ්වාසය කාය සංස්කාර වේ.

★ වාක් සංස්කාර යනු මොනවා ද?

විතර්ක හා විචාර යනු වාක් සංස්කාර වේ. (අරමුණු ගැනීම විතර්ක නම් වේ. අරමුණු සිතින් විමසීම විචාර නම් වේ.)

★ චිත්ත සංස්කාර යනු මොනවා ද?

සංඥා සහ වේදනා යන දෙක චිත්ත සංස්කාර වේ.

★ ආශ්වාස ප්‍රශ්වාස කාය සංස්කාර වනුයේ මන් ද?

ඒවා කායික ක්‍රියා වන බැවින් කාය සංස්කාර වේ.

★ විතර්ක, විචාර වාක් සංස්කාර වනුයේ ඇයි?

පළමුව සිතෙන් විතර්කනය කොට දෙවනුව සිතෙන් විචාර වචන පිට කිරීම සිදුවේ. එබැවින් විතර්ක, විචාර වාක් සංස්කාර නම් වේ.

★ සංඥා, වේදනා දෙක චිත්ත සංස්කාර වනුයේ ඇයි?

මේ දෙකම චෛතසික ධර්ම වේ. එමෙන්ම මේ දෙකම සිත හා බැඳී පවතී. එබැවින් සංඥා, වේදනා දෙක චිත්ත සංස්කාර වේ.

★ නිරෝධ සමාපත්තිය කෙබඳු ද?

නිරෝධ සමාපත්තියට සමවදින භික්ෂුවට මම නිරෝධ සමාපත්තියෙහි සිටිමි; යන්න නොහැඟෙයි. එනමුත් සමවතට සමවැදීමට පෙර මෙතෙක් කල් අචිත්තකව සිටිමි යනුවෙන් නිරෝධ සමාපත්තියෙහි යෙදී සිටින කාලය ඉටා ගනියි.

★ නිරෝධ සමාපත්තියට සමවැදීමට උත්සාහ දරන්නාගේ කාය, චිත්ත, වාග් සංස්කාර නිරුද්ධ වනුයේ කවර අනුපිළිවෙළකට ද?

1. පළමුව වචී සංස්කාර නැතිවෙයි. (ද්විතීය ධ්‍යානයේ දී මෙම තත්ත්වය ඇති වේ.)

2. දෙවනුව කාය සංස්කාර නැතිවේ. (චතුර්ථ ධ්‍යානයේ දී මෙම තත්ත්වය ඇති වේ.)

3. තෙවනුව චිත්ත සංස්කාර සංසිඳෙයි. (නිරෝධ සමාපත්තියට එළඹුණු අවස්ථාව මෙයින් අදහස් වේ.)

(පළමු, දෙවැනි ආදී ධ්‍යාන ඉක්මවමින් අරූප ධ්‍යාන ලැබ ඉන් අනතුරුව අරූප ධ්‍යාන උපුටා දමා නිරෝධ සමාපත්තියට සමවැදිය යුතුය. එබැවින් කාය, චිත්ත, වාක් සංස්කාර සංසිඳෙනුයේ මේ පිළිවෙළටමය.)

★ නිරෝධ සමාපත්තියට සමවැදුණු අය ඉන් පිබිදෙන්නේ කෙලෙස ද?

නිරෝධ සමාපත්තියෙන් පිබිදෙන විට මම නිරෝධ සමාපත්තියෙන් නැගිටිමි යන්න නොසිතෙයි. තමා ඉටාගත් කාලය අවසන් වත්ම නිරෝධ සමාපත්තියෙන් පිබිදෙයි.

★ නිරෝධ සමාපත්තියෙන් පිබිදෙන භික්ෂුවට කාය, වාක්, චිත්ත සංස්කාරයන්ගෙන් කුමක් පළමුව උපදී ද?

1. පළමුව චිත්ත සංඛාර උපදී (සිත ක්‍රියාකාරී වෙයි.)

2. දෙවනුව කාය සංඛාර උපදී (හුස්ම වැටීම ඇරඹෙයි.)

3. තෙවනුව වචී සංඛාර උපදී (ධ්‍යාන එකින් එක පහළ බසින විට මෙය සිදුවේ.)

★ නිරෝධ සමාපත්තියෙන් නැගී සිටින භික්ෂුව කී ආකාර ඇනුමක් ස්පර්ශ කරයි ද?

තුන් ආකාර ඇනුමක් ස්පර්ශ කරයි.

1. සුන්‍යතාව ස්පර්ශ කරයි.

2. නිමිති රහිත බව ස්පර්ශ කරයි.

3. ඇල්ම නැති බව ස්පර්ශ කරයි. (අප්පණිහිත බව ස්පර්ශකරයි.)

(නිවනෙහි ගුණාංග වන සුඤ්ඤත, අනිමිත්ත, අප්පණිහිත යන ගුණාංග පිරිසිඳ අවබෝධ කර ගනියි.)

★ නිරෝධ සමාපත්තියෙන් නැගී සිටි භික්ෂුවගේ සිත කුමකට යොමුව පවතී ද?

සිත විවේකයට යොමුව පවතී.

★ වේදනාවන් කීයක් ඇද්ද?

වේදනාවන් තුනකි.

1. දුක් වේදනා

2. සැප වේදනා

3. සැප හෝ දුක් නොවන (උපේක්ෂා) වේදනා

★ දුක් වේදනා යනු කුමක් ද?

අමිහිරක් ගෙන දෙන කායික හෝ මානසික ස්වභාවයේ වේදනාව දුක් වේදනාවයි.

★ සැප වේදනා යනු කුමක් ද?

කායික හෝ මානසික සැපයක් ගෙන දෙන වේදනාව සැප වේදනාවකි.

★ උපේක්ෂා වේදනා යනු කුමක් ද?

කායික හෝ මානසික, මිහිරක් හෝ අමිහිරක් නොදෙන වේදනාව උපේක්ෂා වේදනාවයි.

★ සැප වේදනාවෙහි කවරාකාර සැපයක් ඇද් ද?

සැප වේදනාව ඇති විට මිහිරක් ද, නැති විට අමිහිරක් ද දැනේ.

★ දුක් වේදනාවෙහි කවරාකාර දුකක් ඇද් ද?

දුක් වේදනාව නැති විට මිහිරක් ද, ඇති විට අමිහිරක් ද දැනේ.

★ උපේක්ෂා වේදනාවෙහි කවරාකාර උපේක්ෂා ගුණයක් දැනේ ද?

නුවණින් සලකා බලන විට සැපක් ද නුවණින් සලකා නොබලන කල එහි දුකක් ද ඇත්තේය.

★ දුක් වේදනාවෙහි කවර අනුසයක් (රාග ද්වේෂාදී ප්‍රකට දුබලතාවක්) ඇත් ද?

දුකෙහි පටිඝය ඇත. (කෝපයට, වෛරයට හේතු වනුයේ පටිඝයයි.)

★ සැප වේදනාවෙහි කවර අනුසයක් ඇද් ද?

සැපයෙහි රාගය උපදියි.

★ උපේක්ෂාවෙහි කවර අනුසයක් ඇද් ද?



CS CamScanner

එහි අවිජ්ජාව (අවිද්‍යාව) ඇත.

★ සෑම සැප වේදනාවකම රාගානුසය ඇද් ද?

නැත.

★ සෑම දුක් වේදනාවකම පටිඝානුසය ඇද් ද?

නැත.

★ සෑම උපේක්ෂා වේදනාවකම අවිජ්ජානුසය ඇද් ද?

නැත.

★ වේදනාවන්හි කුමක් පහ කළ යුතු ද?

1. සැප වේදනාවෙහි රාගය (ඇල්ම)
2. දුක් වේදනාවෙහි පටිඝය
3. උපේක්ෂා වේදනාවෙහි අවිද්‍යාව පහ කළ යුතුය.

★ සෑම සැපයකම රාගානුසය පහ කළ යුතු ද?
සෑම දුකකම පටිඝානුසය පහ කළ යුතු ද?
සෑම උපේක්ෂා වේදනාවකම අවිද්‍යානුසය පහ කළ යුතු ද?
නැත.

1. කාමයෙන් වෙන්ව ප්‍රථම ධ්‍යානයෙහි යෙදී සිටින කල රාගය පහ වෙයි.
2. කවදා හෝ රහත් වෙමිය යන අදිටන අදිටන් කළ විට ඒ කැමැත්ත නිසා පටිඝය පහ වෙයි.
3. සැපයත් දුකත් පහ කර චතුර්ථ ධ්‍යානයෙහි සිටියි. එහි අවිද්‍යාව නැත.

★ සැප වේදනාවට ප්‍රතිවිරුද්ධ දෙය කුමක් ද?

දුක් වේදනාවයි.

★ දුක් වේදනාවට ප්‍රතිවිරුද්ධ දෙය කුමක් ද?

සැප වේදනාවයි.



CamScanner

★ උපේක්ෂා වේදනාවට ප්‍රතිභාග වන දෙය කුමක් ද?

අවිද්‍යාවයි.

★ අවිද්‍යාවට ප්‍රතිභාග වන දෙය කුමක් ද?

විද්‍යාවයි.

★ විද්‍යාවට පසුව ප්‍රතිභාග වන දෙය කුමක් ද?

විමුක්තියයි.

★ විමුක්තියට ප්‍රතිභාග වන දෙය කුමක් ද?

නිර්වාණයයි.

★ නිර්වාණයට ප්‍රතිභාග වන දෙය කුමක් ද?

නිර්වාණය අවසානය බැවින් ඊට ප්‍රතිභාග ලෙස කිසිවක් නොමැත.



CamScanner

## 35. මහා පරිනිර්වාණ සූත්‍රය - ආලාර, වේදල්ලය

පුක්කුස නම් වූ මල්ල රට වැසියා බුදුන් වහන්සේ හමුවී වැදගත් තොරතුරක් හෙළිදරව් කළේය.

දිනක් ආලාරකාළාම දිගු ගමනක් යන අතර ගසක් මුල සමාධි සුවය විඳින්නට පටන් ගත්තේය. ඔහු පසු කර ගැල් පන්සියයක් ගිය නමුත් ඔහුගේ අවධානය ඒ වෙත යොමු නොවීය. ඒ දුටු එක් මිනිසෙක් ආලාරකාළාම වෙත ගොස් එකී ගැල් සමූහය දුටුවේ ද යන්න විමසුවේය.

"මා එම ගැල් සමූහය දුටුවේ නැත."

ආලාරකාළාම පිළිතුරු දුන්නේය.

"ඔබතුමාට ඇසුණේත් නැද්ද?"

"නැහැ, මට ඇසුණේත් නැහැ"

"එසේ නම් ඔබතුමා ගස මුල නිදා සිටියේ ද?"

"නැත, මා නිදා සිටියේ නැත."

"ඔබතුමා හොඳ සිහියෙන් සිටියේ ද?"

"ඔව්, මම මෙතෙක් හොඳ සිහියෙන් සිටිමි"

"ඔබගේ සිවුර පවා දූවිල්ලෙන් නැවී ගොසිනි."

"ඔව්, මම දැන් එය දකිමි."

ආලාරකාළාමගේ සමාධියෙහි ගැඹුර දැක ඒ පුද්ගලයා මහත් සේ පැහැදුණේය.

පුක්කුසගේ ඒ කතාව අසා සිටි බුදුහු තමන් වහන්සේ මුහුණ පෑ සිද්ධියක් හෙළි කළ සේක.

බුදුන් වහන්සේ එක් දිනක ආතුමා නම් නගරාසන්නයෙහි පිදුරුවලින් කළ මඩුවක් තුළට වී සමාධි සුවය වින්ද සේක. එවිට මහ වැස්සක් වැස අකුණු පහරින් මිනිසුන් සිව් දෙනෙක් ද, ගොන්නු සතර දෙනෙක් ද එතැනම මළහ. අකුණු පහරින්

වූ විනාශය දැකීමට එතැනට සෙනඟ රැස්වූහ. මේ අවස්ථාවේදී බුදුහු සමවතින් නැගී සිට සක්මන් කරන්නට පටන් ගත්හ. රැස්ව සිටි පිරිස සිදු වූ දෙය පිළිබඳව බුදුන්ගෙන් විමසූහ. එම අවස්ථාවේදී එතැනම වැඩ සිටියත්, අකුණු පහර ගසනු තමන් වහන්සේ නුදුටු බවත්, නොඇසුණු බවත්, තමන් වහන්සේ හොඳ සිහිනුවණින් යුතුව සමාධි සුවයෙන් කල් ගෙවූ බවත් බුදුහු රැස්ව සිටි පිරිසට හෙළි කළහ.

(ආලාරකාළාම අරූපාවචර ධ්‍යානලාභියෙකි. ඔහු සත්වන ධ්‍යානය උපයාගෙන සිටියේය. අරූපාවචර ධ්‍යානවල යෙදුණු කල ශබ්ද නොඇසෙයි. සමාධිගතව සිටි බුදුන් වහන්සේට ද ආලාරකාළාමට ද ශබ්ද නෑසුණේ එම අවස්ථාවන්හිදී අරූප සමාධීන් වෙත සමවැදී සිටි නිසා බව නිගමනය කළ හැකිය.)